(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4.]

# පාර්ලිමේන්තුවේ
# න්‍යාය පුස්තකය

**2021 ජූනි 08 අඟහරුවාදා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2021 මැයි 21 සිකුරාදා**

**2021 ජූනි 08 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

12/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේදී ඇති වූ නියඟය හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පීඩාවට පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ අතරට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් නොවන්නේ නම්, හේතු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ සහන ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 වර්ෂයේ නියං සහනාධාර ලබා දීමේ අදියර II යටතේ නිකුත් කළ චක්‍රලේඛ;

(ii) ඒ අතරින් අවසන්වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය;

(iii) එම චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ සහනාධාර ගෙවීමට වැය කළ මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) NDR/2018/03 චක්‍රලේඛයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

246/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

274/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම පාඨමාලාව පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම පාඨමාලාව හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) උපාධි පාඨමාලාවකට සමාන මෙම පාඨමාලාවට සිදු කරන ලද සංශෝධන මඟින් ඩිප්ලෝමා පාඨමාලාවක තත්ත්වය දක්වා පහත දමා ඇති බවත්;

(iii) එම පාඨමාලාව නවතා දැමීම සඳහා මේ වනවිට කටයුතු කරමින් සිටින බවත්;

එතුමිය දන්නෙහිද?

(ඇ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව උපාධි පාඨමාලාවක තත්වයට නැවත ලබා දීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ආයුර්වේද ශාස්ත්‍රී උපාධිධාරීන්ට අනෙකුත් ආයුර්වේද වෛද්‍යවරුන්ට හිමි වරප්‍රසාද ලබාදීමට රජය කටයුතු කරන්නේද;

(iii) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම නැවත ආරම්භ කරන්නේද;

(iv) එම පාඨමාලාව නතර කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

444/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය නමින් ආයතනයක් තිබෙන බව දන්නේද;

(ii) එම ආයතනයේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විදේශ රැකියා අවස්ථා බෙදා හැරීමේදී එම ආයතනය විසින් වංචා සහ දූෂණ සිදු කරනු ලබන බව දන්නේද;

(iv) එම වංචා සහ දූෂණ වළක්වා ගැනීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

731/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

(ii) අනුරාධපුරය හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල පවතින වියළි කාලගුණය අවසන්ව නැවත වැසි ලැබීමත් සමග මදුරු ගහනය වර්ධනය වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනතෙක් ඩෙංගු රෝගයට ගොදුරුවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඩෙංගු මදුරු කීටයන් විනාශ කිරීමට 2008/2009 වකවානුවේදී එවකට පැවති රජය විසින් B.T.I. බැක්ටීරියාව කියුබාවෙන් ආනයනය කිරීමට විවිධ උත්සාහයන් ගත් නමුත් එය අසාර්ථක වූ බවත් එතුමිය දන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට හැකියාවක් නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) B.T.I. බැක්ටීරියාව වෙනුවට ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිතා කළ හැකි විකල්පය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

783/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1989 – 1990 කාල සීමාව තුළ රජයේ ගුරු සේවයට බඳවා ගනු ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම ගුරුවරුන් විශ්‍රාම යාමේ අවධියට ආසන්නව සිටින බවත්;

(ii) එම ගුරුවරු විශ්‍රාම යෑමත් සමඟ ගුරු සේවයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම තත්ත්වය තුලනය කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

864/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සතු රාජ්‍ය ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය ඔසුසල් පිහිටා නොමැති දිස්ත්‍රික්ක තිබේ නම්, එම දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය රජය සමයේ ගුණාත්වයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කළ බව එතුමිය දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කර ඇති ගුණාත්වයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ ප්‍රමාණය;

(ii) එම ඖෂධවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය ඔසුසල් සඳහා කල් ඉකුත් වූ ඖෂධ නිකුත් කිරීමට හේතු;

(ii) එම ඖෂධවල වටිනාකම අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට ගනු ලැබූ පියවර;

(iii) වටිනාකම අයකර ගෙන නොමැති සැපයුම්කරුවන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

938/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් "ළඟම පාසල හොඳම පාසල" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත්;

(ii) ඒ යටතේ කොළඹ අධ්‍යාපන කලාපය තුළ පිහිටි සුසමයවර්ධන විද්‍යාලය, ශාන්ත අන්තෝනි පිරිමි විද්‍යාලය, මහාබෝධි විද්‍යාලය, අනුරුද්ධ බාලිකා විද්‍යාලය, ශාන්ත අන්තෝනි බාලිකා (ප්‍රාථමික) විද්‍යාලය, මුතුවෙල්ල හින්දු විද්‍යාලය සහ මෝදර ආනන්ද විද්‍යාලය යන විද්‍යාල සංවර්ධනය කිරීම ආරම්භ කළ බවත්;

(iii) ඒ සඳහා පසුගිය රජය විසින් මුදල් වෙන් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ කොළඹ 12-හමීඩ් අල් හුසෙනි විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මුල්ගල තැබූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත අ(ii)හි සඳහන් පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

946/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති වේලනයිතුරෙයි සිට පුංගුඩුතිව්, මඩත්තුවෙළි දක්වා වන පාලම ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දිගම පාලම්වලින් එකක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ දිග කොපමණද;

(ii) එම පාලම අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද වර්ෂය කවරේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පාලම මතින් ගමන් කිරීම දැඩි අවදානම් සහගත බවත්;

(ii) සාමාන්‍ය ජනතාව සහ වාහන විශාල ප්‍රමාණයක් ගමන් කරන මෙම පාලම මතදී බොහෝ අනතුරු සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම අනතුරු සිදු වීමට බලපාන හේතු කවරේද;

(ii) එම පාලම සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1428/2021

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ආගමික, සංස්කෘතික, සුහසාධන හා වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු පිණිස මාගේ ඉල්ලීම පරිදි එවකට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි සංස්කෘතික මධ්‍යස්ථාන 16ක් ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී අනුමැතිය ලබාදී ඒ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරන ලද බවත්;

(ii) ඒ අතරින් සංස්කෘතික මධ්‍යස්ථාන 14ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද බවත්;

(iii) එහෙත් මේ වනවිට එම සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහන නතර වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රුපියල් මිලියන 20.5ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබේද;

(ii) එම සංස්කෘතික මධ්‍යස්ථාන 16 ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

* 1.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 58 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 58 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 33101 "රජයේ සේවකයන්ගේ අත්තිකාරම් ගිණුම - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 47,300,000 සිට රු. 42,500,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 59 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 59 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 620,000,000 සිට රු. 450,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 60 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 60 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,000,000 සිට රු. 1,120,600 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 61 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 61 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 25003 "විවිධ අත්තිකාරම් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,000,000 සිට රු. 430,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 62 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 62 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 28502 "කෘෂිකාර්මික ගොවිපළ නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 620,000,000 සිට රු. 645,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 620,000,000 සිට රු. 645,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 63 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 63 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 ''ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,700,000,000 සිට රු.1,000,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.7,500,000,000 සිට රු.8,200,000,000දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 64 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 64 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000<br>රු. 50,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 40,000,000<br>රු. 70,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 8),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 65 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 65 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "කළවැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 420,000,000 සිට රු.300,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 9),— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා වෙත පැවරුනු බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(මෙම නියමයන් වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

<u>උපලේඛනය</u>

(අමුණා ඇති උපලේඛනය පරිදි)

# උපලේඛනය

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2020 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

**කණ්ඩායම් විධාන අංක 01**

2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතලවලට අනුව මහින්ද රාජපක්ෂ වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය අනුව මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00601, 01701, 02001, 02301, 10101, 10301, 11201, 11501, 11801, 12201, 12301, 12601, 13001, 13501, 15101, 17601. 19301, 19401, 19801, 40101, 40301, 40401, 40501, 40601, 40801, 40901, 41001, 41101, 41201, 41401, 41601, 41701, 41901, 42101, 42201, 42301, 42401, 42501, 42601, 42701, 42801, 42901, 43001, 43101, 43301, 43401, 43501, 43601, 43701, 43801, 43901, 44001, 20901, 21601, 23501 , 27201 සහ 27701ට අදාළ වන්නා වූ පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | **00601** | | | | | **30,000,000** | **38,000,000** | 1 |
| 2 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | **01701** | | | **2,000,000** | **1,100,000** | | | 2 |
| 3 | මැතිවරණ කොමිෂන් සභාව | **02001** | | | | | **85,000,000** | **115,000,000** | 3 |
| 4 | විගණන සේවා කොමිෂන් සභාව | **02301** | | | **1,600,000** | **600,000** | **4,000,000** | **6,000,000** | 4 |
| 5 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා | **10101** | | | **31,000,000** | **8,000,000** | | | 5 |
| 6 | ආරක්ෂක අමාත්‍යවරයා | **10301** | **38,500,000** | **75,000,000** | | | | | 6 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | විදේශ අමාත්‍යවරයා | 11201 | | | | | 120,000,000 | 124,000,000 | 7 |
| 8 | බලශක්ති අමාත්‍යවරයා | 11501 | | | 2,500,000 | 2,400,000 | | | 8 |
| 9 | කෘෂිකර්ම අමාත්‍යවරයා | 11801 | | | 33,000,000 | 29,000,000 | | | 9 |
| 10 | ඉඩම් අමාත්‍යවරයා | 12201 | | | 12,500,000 | 9,000,000 | | | 10 |
| 11 | නාගරික සංවර්ධනය හා නිවාස අමාත්‍යවරයා | 12301 | 7,100,000 | 37,000,000 | | | | | 11 |
| 12 | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | | | | | 2,540,000,000 | 3,100,000,000 | 12 |
| 13 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා | 13001 | | | 28,500,000 | 22,000,000 | | | 13 |
| 14 | වැවිලි අමාත්‍යවරයා | 13501 | | | 14,500,000 | 5,820,000 | | | 14 |
| 15 | ධීවර අමාත්‍යවරයා | 15101 | | | 4,000,000 | 2,100,000 | | | 15 |
| 16 | වරාය හා නාවික අමාත්‍යවරයා | 17601 | | | | | 18,000,000 | 18,600,000 | 16 |
| 17 | කම්කරු අමාත්‍යවරයා | 19301 | | | | | 52,000,000 | 55,600,000 | 17 |
| 18 | තරුණ හා ක්‍රීඩා අමාත්‍යවරයා | 19401 | | | 21,500,000 | 14,300,000 | | | 18 |
| 19 | වාරිමාර්ග අමාත්‍යවරයා | 19801 | | | 4,400,000 | 2,500,000 | 40,000,000 | 50,000,000 | 19 |
| 20 | ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | 40101 | | | 1,200,000 | 500,000 | | | 20 |
| 21 | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යවරයා | 40301 | | | 28,000,000 | 14,500,000 | | | 21 |
| 22 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40401 | | | 1,500,000 | 0.000 | | | 22 |
| 23 | විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යවරයා | 40501 | | | 950,000 | 86,000 | | | 23 |
| 24 | සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40601 | | | 1,200,000 | 266,000 | | | 24 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 25 | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | **40801** | | | **23,500,000** | **3,800,000** | | | 25 |
| 26 | අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යවරයා | **40901** | **52,300,000** | **551,000,000** | | | | | 26 |
| 27 | සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | **41001** | | | **2,000,000** | **74,000** | | | 27 |
| 28 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | **41101** | | | **4,200,000** | **3,900,000** | | | 28 |
| 29 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයා | **41201** | | | **26,500,000** | **13,000,000** | **50,000,000** | **64,000,000** | 29 |
| 30 | සමෘද්ධි සහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | **41401** | **4,400,000** | **5,600,000** | | | | | 30 |
| 31 | දේශීය වෛද්‍යකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා | **41601** | | | **10,000,000** | **4,200,000** | | | 31 |
| 32 | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යවරයා | **41701** | | | **7,200,000** | **7,126,989.02** | | | 32 |
| 33 | කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | **41901** | | | **500,000** | **350,000** | | | 33 |
| 34 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යවරයා | **42101** | | | **18,000,000** | **16,000,000** | | | 34 |
| 35 | දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයා | **42201** | **5,600,000** | **30,000,000** | | | | | 35 |
| 36 | ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යවරයා | **42301** | | | **4,000,000** | **2,750,000** | | | 36 |
| 37 | වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | **42401** | | | **1,200,000** | **65,000** | | | 37 |
| 38 | වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා | **42501** | | | **2,200,000** | **20,000** | | | 38 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 39 | පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යවරයා | 42601 | 9,500,000 | 200,000 | 39 |
| 40 | පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 42701 | 12,200,000 | 9,500,000 | 40 |
| 41 | මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42801 | 1,000,000 | 400,000 | 41 |
| 42 | ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42901 | 1,500,000 | 205,000 | 42 |
| 43 | ඉඩම් කළමණාකරන කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43001 | 1,000,000 | 120,000 | 43 |
| 44 | පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයා | 43101 | 1,500,000 | 70,000 | 44 |
| 45 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43301 | 850,000 | 50,000 | 45 |
| 46 | ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43401 | 1,200,000 | 35,000 | 46 |
| 47 | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යවරයා | 43501 | 1,000,000 | 200,000 | 47 |
| 48 | වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 43601 | 1,500,000 | 80,000 | 48 |
| 49 | ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43701 | 1,200,000 | 100,000 | 49 |
| 50 | සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යවරයා | 43801 | 2,500,000 | 2,000,000 | 50 |
| 51 | බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයා | 43901 | 1,200,000 | 100,000 | 51 |
| 52 | මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 44001 | 850,000 | 45,000 | 52 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 53 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | **20901** | | | **3,600,000** | **3,100,000** | 53 |
| 54 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | **21601** | | | **13,400,000** | **12,500,000** | 54 |
| 55 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | **23501** | | | **700,000** | **472,256** | 55 |
| 56 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | **27201** | **80,000,000** | **85,000,000** | | | 56 |
| 57 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | **27701** | **30,000,000** | **30,580,000** | | | 57 |

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 23 දිනැති අංක 2207/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*11.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 06 දිනැති අංක 2222/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අධිකරණ අමාත්‍යතුමා,— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි II කොටසේ 10(1) වගන්තිය මඟින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ඉටු කරලීම පිණිස උක්ත පනතේ 4(1) හා 6 වගන්ති ප්‍රකාරව සාමාජිකයන් 07 දෙනෙකු පත් කර ඇති අතර ඉන් එක් සාමාජිකයෙකු එම කාර්යාලයේ සභාපතිවරයා වශයෙන් පත් කර ඇති හෙයින් ද;

එම නිලධාරින් හට 2016 අංක 14 දරන පනතේ 20 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන වැටුපක් ගෙවීමට හා එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බවට සඳහන් වී ඇති හෙයින් ද;

අංක 18/0689/705/001 හා 2018.06.05 දිනැති සංශෝධිත අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දුන් අනුමතිය හා 2018.09.04 දිනැතිව පාර්ලිමේන්තුවේ සම්මත වූ යෝජනාව අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හට රු.100,000/-ක මාසිකව දීමනාවක්ද, රු.10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, මාසිකව ඉන්ධන ලීටර් 225ක් ද, එම කාර්යාලයේ සාමාජියන් හට රු.75,000/- ක මාසික දීමනාවක් ද, රු.8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද හා නිවසේ සිට කාර්යාලය වෙත ඇති දුර ප්‍රමාණය මත පදනම්ව කි.මී.350ක සීමාවක් දක්වා රු.25,000/- හෝ කි.මී.350ක් හෝ ඊට වැඩි දුර ප්‍රමාණයක් සඳහා රු.50,000/-ක ප්‍රවාහන දීමනාවක් ද සඳහා හිමිකම් ලබන හෙයින් ද;

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති හානි පූර්ණ කාර්යාලයේ සාමාජිකයන් සඳහා වැටුප් තීරණය කරනු ලබන්නේ ද පාර්ලිමේන්තුව විසින් වන අතර 2019.09.20 දිනැතිව සම්මත කරන ලද යෝජනාව අනුව එම නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය කර ඉහළ අගයක් ලබා දී ඇති හෙයින් ද;

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ඇතුළු සාමාජියන් හට ද 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි 20 වගන්තිය ප්‍රකාරව 2020.11.30 දින සිට වේතන හා දීමනා පහත පරිදි ගෙවීමට තීරණය කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අංක අමප/21/0362/330/022 හා 2021.03.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමතිය ලබා දී ඇති හෙයින් ද:—

(අ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හට මාසික දීමනාව, දැනට ලබා දෙන ඉන්ධන හා දුරකථන දීමනාවට අමතරව රු.100,000/- සිට රු.135,000/- දක්වා වැඩි කිරීම;

(ආ) සභාපතිවරයාගේ භාවිතය සඳහා නිල වාහනයක් ලබා නොදෙන අවස්ථාවල අංක PED 1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් වන පරිදි සභාපතිවරයාගේ පෞද්ගලික වාහනය රාජකාරි සඳහා භාවිතා කිරීම වෙනුවෙන් රු.50,000/-ක මාසික දීමනාවක් ලබා දීම; සහ

(ඇ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් හට මාසික දීමනාව, දැනට ලබා දෙන ඉන්ධන හා දුරකථන දීමනාවට අමතරව රු.75,000/- සිට රු.90,000/- දක්වා වැඩිකර ගෙවීම.

ඊට අනුකූලව, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි 20 වගන්තිය ප්‍රකාරව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ඇතුළු සාමාජිකයන් හට රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප් හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*13.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2021 ජූනි 09 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

37/2020

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාව වෙත ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා වර්තමානයේදී අවශ්‍ය වන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2019.01.01 දිනය වනවිට රාජ්‍ය සේවය තුළ සේවයේ යෙදී සිටි වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉදිරි වර්ෂවලදී රාජ්‍ය සේවයට බඳවා ගැනීමට යෝජිත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව බිහිකර ගැනීම සඳහා රජය සැලසුම් සකස් කර ඇති ආකාරය කෙසේද?

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

275/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ මිදි නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මිදි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති මිදි ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) මිදි වගාව සඳහා සුදුසු දේශගුණික තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 හා 2019 වර්ෂවලදී ශ්‍රී ලංකාවට මිදි ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව මිදී අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී මිදි අපනයනය කිරීමෙන් ලබන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

446/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එන්ජින් අතරින් මේ වනවිට ධාවනයට යොදවා ඇති දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ධාවනයට යොදවා නොමැති දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දුම්රිය එන්ජින් ධාවනයට යොදවා නොගැනීමට හේතු කවරේද;

(v) එම දුම්රිය එන්ජින් කඩිනමින් ධාවනයට යොදවා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

724/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව, මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඖෂධ වෙළඳසැල් (ඔසුසල්) පිහිටා නොමැති බවත්;

(ii) ඉහත දිස්ත්‍රික්කවල ජීවත්වන සාමාන්‍ය ජනතාව ඇතැම් ඖෂධ ලබා ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කවල මේ වනතෙක් රජයේ ඔසුසල් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) එම දිස්ත්‍රික්කවල රජයේ ඔසුසල් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

820/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) එම බන්ධනාගාරවල රඳවා තැබිය හැකි රැඳවියන් සංඛ්‍යාව හා මේ වනවිට රඳවා තබා ඇති රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ධාරිතාවය ඉක්මවා රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(v) රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

849/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කඳුරුවෙල විකල්ප මාර්ගයේ කි.මී. 0 + 000 සිට කි.මී. 2 + 687 දක්වා වූ මාර්ග කොටස, මංතීරු 4ක මාර්ගයක් ලෙස පුළුල් කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට, රජයේ බීජ වී ගොවිපොළට අයත්වන සහ ප්‍රදේශවාසීන් විසින් භුක්ති විඳින ලද ගොඩ ඉඩම්, මඩ ඉඩම්, මුඩු ඉඩම්, ගෙවතු ඉඩම් සහ ස්ථිර ගොඩනැගිලි සහිත ඉඩම් රජයට පවරාගෙන තිබේද?

(ii) එසේ නම්, එලෙස පවරාගෙන ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) පවරාගත් ඉඩම්වල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වන්දි මුදලක් ගෙවා තිබේද;

(v) එසේ නම්, ගෙවනු ලැබූ වන්දි මුදල එක් එක් ඉඩම් හිමිකරු අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් මාර්ග කොටස පුළුල් කිරීම යටතේ මේ වනවිට වැඩ නිම කර ඇති දුර ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

997/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන විද්‍යාපීඨවල පුහුණු පාඨමාලාවන් මෑතකදී හදාරා අවසන්කර ඇති ඩිප්ලෝමාධාරින් සඳහා මේ වනතෙක් ගුරු පත්වීම් ලබා දී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් මෑතක සිට ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගුරු හිඟයට පිළියමක් ලෙසද, දරුවන්ගේ අධ්‍යාපනය ඉහල නැංවීම සඳහා ද විද්‍යා පීඨවල පුහුණු පාඨමාලාවන් හදාරා අවසන්කර ඇති මෙම ඩිප්ලෝමාධාරින් සඳහා ගුරු පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1063/2020

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අලි - මිනිස් ගැටුම පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සැරිසරන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වන අලින් පළවා හැරීමට සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම වන අලින් පළවා හැරීමට අදාළ නිලධාරීන්ගේ භිහය මගහරවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජූනි 10 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

74/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වී ඇති නමුත් මේ වනතෙක් තීන්දුවක් ලබා දී නොමැති මානව හිමිකම් නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වූ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් නඩුවට අදාළ නඩු අංකය සහ පැමිණිලිකරුවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

276/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ කෙසෙල් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කෙසෙල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති කෙසෙල් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) කෙසෙල් වගාව සඳහා සුදුසු දේශගුණ තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව කෙසෙල් ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී කෙසෙල් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව කෙසෙල් අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී කෙසෙල් අපනයන කිරීමෙන් ලබන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

447/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි අතරින් මේ වනවිට ධාවනයට යොදා ගනු ලබන දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ධාවනයට යොදා ගනු නොලබන දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iv) එම දුම්රිය මැදිරි ධාවනයට යොදා නොගැනීමට හේතු කවරේද;

(v) එම දුම්රිය මැදිරි කඩිනමින් ධාවනයට යොදා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

459/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලීටර් 13,200ක ඉන්ධන ප්‍රවාහන ධාරිතාවයකින් යුත් ටැංකි සහිත රථ 05ක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩරය කැඳවනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) එම ටෙන්ඩරය එවකට අදාළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රථ 05 මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල;

(ii) එක් රථයක් මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල;

(iii) එම රථ මිලදී ගන්නා අවස්ථාව වනවිට එක් රථයක වෙළඳපොළ වටිනාකම;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

745/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගල්නෑව පොලිස් ස්ථානය ආරම්භ කරන ලද දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අබලන් තත්ත්වයක පවතින බවත්;

(ii) ආරම්භ කරන ලද දින සිට මේ වනතෙක් එම ගොඩනැඟිලි ප්‍රමාණවත් පරිදි අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

867/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1970 කාලය වන තෙක් ක්‍රියාත්මකව පැවති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි කින්නියා සංචාරක අධිකරණය, උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුද්මය වාතාවරණය හේතුවෙන් තාවකාලිකව වසා දැමූ බවත්;

(ii) ස්ථිර ගොඩනැගිලි ඉදිකරන තෙක් එම අධිකරණ කටයුතු රජයේ ගොඩනැගිල්ලක තාවකාලිකව නැවත ආරම්භ කිරීමට පසුගිය වර්ෂයේදී පියවර ගනු ලැබුවද මේ වන තෙක් එම අධිකරණයේ කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය අධිකරණයේ ගොනු වන නඩු සංඛ්‍යාව අවම කිරීම සඳහා සහ කින්නියා ප්‍රදේශයේ ජනතාව නඩු කටයුතු වෙනුවෙන් ත්‍රිකුණාමලය වෙත යාමේදී ඇති වන දුෂ්කරතාවයන් අවම කිරීම සඳහා කින්නියා සංචාරක අධිකරණය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

874/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පාකිස්ථානය, නේපාලය, බංග්ලාදේශය, මාලදිවයින හා මියන්මාරය ඇතුළු 80 කට අධික රටවල් සංඛ්‍යාවක් කොවිඩ්-19 වසංගතයෙහි ආර්ථික බලපෑම හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වෙතින් හදිසි අවස්ථා ආධාර ලබා ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ආධාර ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, ඉල්ලා ඇති ආධාරවල ස්වභාවය කෙබඳුද;

(iii) ඉහත සඳහන් ආධාර ඉල්ලූ දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතිචාර දක්වා තිබේද;

(v) එසේ නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිචාරය කවරේද;

(vi) මේ දක්වා සහන ලැබී ඇති රටවල් 80 ට මෙන් ශ්‍රී ලංකා රජයට සහන ලැබී නොමැති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

8.

881/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අවශ්‍යතාවය කොපමණද;

(ii) එම අවශ්‍යතාවයෙන් දේශීයව නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1982 වර්ෂයේදී උතුරු සහ නැගෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති යුද්මය තත්ත්වය අවසන්ව මේ වනවිට අවුරුදු 11ක් ගත වුවද, 1982 වර්ෂයේදී එම පළාත්වලින් ලද මත්ස්‍ය අස්වැන්න මේ වනවිට නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ හඳුනාගත් ප්‍රදේශවල මේ වනතෙක් ධීවර වරායන් ඉදිනොකිරීමට හේතු කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ අනෙකුත් පළාත්වල ඉදිකරන ලද ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේදුරුතුඩුව ධීවර වරාය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(iv) මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ආධාරවල ස්වභාවය සහ එම ආධාර මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(v) නෝර්වේ සහ ඩෙන්මාර්ක් රටවලින් ලබා දෙන ණය මඟින් මෙම වරාය ඉදිකිරීමට හේතු කවරේද;

(vi) එමඟින් ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1082/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම සේවකයන් අතරින් මේ වනවිට කොවිඩ්-19 රෝගය වැළඳී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවකයන්ට කොවිඩ්-19 රෝගය වැළඳීම එරට සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයන්ට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1280/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) ඉහළ ගම්මිරිස් අස්වැන්නක් ලබන දිස්ත්‍රික්ක කවරේද;

(iii) එම එක් එක් දිස්ත්‍රික්කයේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්මිරිස් හැර වෙනත් කුළුබඩු වර්ග ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම එක් එක් කුළුබඩු වර්ගයේ වාර්ෂික අවශ්‍යතාවය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආනයනය කරනු ලබන කුළුබඩු වර්ගවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජූනි 11 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

76/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ලියාපදිංචි වී ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පෞද්ගලික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) එම අරමුදලේ සාමාජිකත්වය ලබා ගෙන ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ සේවක සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ලියාපදිංචි වීම සඳහා පැවතිය යුතු අවම සුදුසුකම් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

2.

227/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ බඩ ඉරිඟු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම බඩ ඉරිඟු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම බඩ ඉරිඟු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට බඩ ඉරිඟු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

347/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති, ඉඩම සඳහා ඔප්පු නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ සිදු කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

356/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර, නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් එම ගඟ අපිරිසිදු වී ඇති බවත්;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට එය අහිතකර ලෙස බලපා ඇති බවත්;

(iii) ජලයේ ගුණාත්මක බව රැක ගැනීම පිණිස නිල්වලා ගඟ දෙපස රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ දෙපස අඩි 33ක රක්ෂිත ප්‍රදේශයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වර්ෂය තුළ නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

493/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාසයේ, මධ්‍යම රජයට, පළාත් සභාවට සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගවල දිග ප්‍රමාණය කිලෝ මීටර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත මාර්ග අතරින් මේ වනවිට අබලන් වී ඇති මාර්ගවල දිග ප්‍රමාණය ඉහත සඳහන් එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාසයට අයත් සියලුම මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

620/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වෛද්‍ය උපාධි ප්‍රදානය කරනු ලබන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල කිහිපයක් අසාදු ලේඛනයට ඇතුලත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) එවැනි තීරණයක් ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉහත (අ) (ii) හි සඳහන් විශ්වවිද්‍යාලවලින් උපාධි ලබාගත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

754/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

822/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින විශාල පිරිසකගේ ඉඩම් සඳහා ඔප්පු නොමැති බව පිළිගන්නේද;

(ii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොල්පතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරුදෙනියාය ගම්මානයේ ජනතාව මේ වනවිට අවුරුදු 50කට ආසන්න කාලයක් එහි පදිංචිව සිටින බවත්;

(ii) ඔවුන්ගේ ඉඩම් සඳහා මේ වනතෙක් ඔප්පු ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉරුදෙනියාය ගම්මානයේ පදිංචිව සිටින ජනතාවගේ ඉඩම් සඳහා ඔප්පු ලබා දෙනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1203/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ—

(i) මහා වාරිමාර්ග යටතේ වැව් 14ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 126,242ක් පමණ වන බවත්;

(ii) මධ්‍ය වාරිමාර්ග යටතේ වැව් 83ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 29,775ක් පමණ වන බවත්;

(iii) පළාත් වාරිමාර්ග යටතේ වැව්, 3,019ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 106,185ක් පමණ වන බවත්;

(iv) ඉහත වැව් බොහොමයක මේ වනවිට රොන් මඩ තැන්පත් වී ඇති අතර සැල්වීනියා හා ජපන් ජබර ආදී විවිධ ජලජ පැළෑටි වැවී එම වැව් ගොඩවීමෙන් ඒවායේ ජල ධාරිතාවය අඩු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) සැල්වීනියා හා ජපන් ජබර උපයෝගී කර ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1283/2020

ගරු වරුණ ලියනගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සිට මේ වනතෙක් හඳුනාගෙන ඇති, රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති අධි අවදානම් නිවාස සංඛ්‍යාව;

(ii) එම නිවාසවල පදිංචි වී සිටින නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉහත සඳහන් අධි අවදානම් නිවාසවල පදිංචි වී සිටින පවුල් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමේදී ප්‍රමාදයක් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

පා. 1/2020

ගරු හේෂා විතානගේ මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩ සිටින වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩ සිටින වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා. 2/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීම,— රටකට සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේ දී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට සුදුසු යාන්ත්‍රණයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා. 3/2020

ගරු හේෂා විතානගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම,— කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂිකර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගා ජලය විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මඟින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේ දී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා. 4/2020

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ යෝග්‍ය වැඩසටහනක් රජය විසින් ආරම්භ කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා. 5/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්හී දී නිරන්තරයෙන්ම ගංවතුරෙන් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා. 6/2020

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වානිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යෑමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා. 7/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වාභාවික ආපදා අවම කරගැනීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කය තුළ ස්වාභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානම් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කර ගැනීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

8.

පා. 8/2020

ගරු හේෂා විතානගේ මහතා,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණයවීම වැළැක්වීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණයවීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශ වන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවැනි වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදාහරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳ විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා. 9/2020

ගරු හේෂා විතානගේ මහතා,— දහම් පාසැල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ටසම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇතිකිරීම උදෙසා සියලුම දරුවන්ට (11 ශ්‍රේණිය දක්වා) ඔවුන්ගේ ආගමානුකූලව දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා. 10/2020

ගරු හේෂා විතානගේ මහතා,— ශ්‍රී ලංකාවේ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැඟීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුලපිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා. 11/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා. 12/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මඟින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා. 13/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයන් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයන් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා. 14/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා. 15/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා. 16/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා. 17/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයන්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා. 18/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මඟින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

19.

පා.19/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයින්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

20.

පා.20/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— දුම්රිය මැදිරි දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම,— දුම්රිය දෙපාර්තුමේන්තුව විශාල භෞතික හා මානව සම්පත්වලින් සමන්විත දෙපාර්තුමේන්තුවක් වන හෙයින් ද, මෙරට දුම්රිය මැදිරි විදේශ රටවලින් ආනයනය කිරීමේදී විශාල මුදලක් විදේශ රටවලට ගලා යන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට දුම්රිය මැදිරි මෙරට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

21.

පා.21/2020

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— ශ්‍රී ලංකාව තුළ තැපැල් සේවය ව්‍යාප්ත කොට තිබෙන නමුත්, වර්තමානය වනවිට වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව සඳහා තැපැල් සේවාව විධිමත් කිරීමක් සිදුවී නොමැති හෙයින් ඔවුන් විවිධ අපහසුතාවන්ට ලක් වී සිටින හෙයින් ද, අවුරුදු එකසිය පනහකට ආසන්න කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

22.

පා.22/2020

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

23.

පා.23/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශවල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

24.

පා.24/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය පිළිගැනීම,— ශ්‍රී ලංකා ඉතිහාසයේ ආර්ථික වර්ධනය සඳහා අතිවිශාල දායකත්වයක් සපයන කඳුරට වතු කම්කරුවන් තම අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ ලබාගෙන ඇති හෙයින්, එවැනි අරගලයන්හි දී දිවිපිදූ වෘත්තීය සමිති විරුවන් පොදු දිනකදී අනුස්මරණය කළ යුතු යැයි ශ්‍රී ලංකාවේ ජීවත්වන ඉන්දීය සම්භවයෙන් යුත් කඳුරට ජනතාවගේ දීර්ඝ කාලීන ඉල්ලීම සලකා බලා ඒ අනුව වාර්ෂිකව ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය සැමරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

25.

පා.25/2020

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

26.

පා.26/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

27.

පා.27/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

28.

පා.28/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

29.

පා.29/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

30.

පා.30/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

31.

පා.31/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— බුලත් ගොවීන්ගේ ගැටලු විසඳීම,— වයඹ පළාතේ සැලකිය යුතු පවුල් සංඛ්‍යාවක් බුලත් වගාවේ නිරතව සිටින අතර, වර්තමානය වනවිට එම බුලත් ගොවීන්ට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් එම තත්ත්වය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

32.

පා.32/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පුරන් වූ කුඹුරු අස්වැද්දීම,— රටක සංවර්ධනය සඳහා ආහාරවල සුරක්ෂිතභාවය ඉතා වැදගත් වන හෙයින් වයඹ පළාතේ දැනට පුරන් වී ඇති කුඹුරු යළි අස්වැද්දීම සඳහා කඩිනම් යෝග්‍ය වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

33.

පා.33/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම විසඳීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන රාශියක අලි-මිනිස් ගැටුම ඉතා ප්‍රබලව දක්නට තිබෙන හෙයින් ඒ සඳහා තිරසර විසඳුමක් ලෙස සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

34.

පා.34/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම,— වයඹ පළාතේ විශාල පිරිසක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරත වන හෙයින් ද, එම ගොවි ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයක් වන හෙයින් ද, වයඹ පළාතේ කුඩා වැව් සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

35.

පා.35/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම,— කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බොහෝ ප්‍රදේශවල පුරාවිද්‍යා ස්ථාන රාශියක් තිබෙන හෙයින් අනාගත පරපුර වෙනුවෙන් ඒවා ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

36.

පා.36/2020

ගරු එච්. නන්දසේන මහතා,— වන සීමා පුළුල් කිරීම හේතුවෙන් ගොවීන්ට වසර ගණනාවක් වගා කළ ඉඩම් අහිමි වීමෙන් සිදුවන හානිය වළකාලීම,— 2001.08.10 දින වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලැබූ 5/2001 චක්‍රලේඛය පදනම් කර ගනිමින් වන සීමා පුළුල් කිරීමේදී දීර්ඝ කාලයක් පුරාවට වගා කරන ලද ගොවි බිම්, වන සීමාවට ඇතුළත්වීම හේතුවෙන් එම ගොවි ජනතාවට අසාධාරණයක් සිදුවූ හෙයින් ද, අදාළ නිලධාරීන් වගකීමෙන් කටයුතු කර නොමැති හෙයින් ද, මෙම තත්ත්වයට මුහුණ පා සිටින අසරණ ගොවි ජනතාවට සාධාරණය ඉටුකර දීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

37.

පා.37/2020

ගරු එච්. නන්දසේන මහතා,— රජයේ පාසල්වල වසර 15කට අධික කාලයක් ඉගැන්වීම් කටයුතුවල යෙදී සිටි සිවිල් ආරක්ෂක නිලධාරීන් හට ගුරු පුහුණුව ලබා දී ගුරු සේවයට ඇතුළත් කර ගැනීම,— ත්‍රස්ත ප්‍රහාර උත්සන්නව පැවති සමයේ දී තර්ජිත ගම්මානවල පිහිටි පාසල්වල විශාල ගුරු හිඟයක් පැවති හෙයින්, පාසල් දරුවන් සඳහා ඉගැන්වීම් කටයුතු වර්තමානය දක්වාම සිවිල් ආරක්ෂක නිලධාරීන් පිරිසක් විසින් සිදු කරනු ලැබූ හෙයින් ද, උතුරු නැගෙනහිර පළාත්වල එවන් නිලධාරීන් ගුරු සේවයට ඇතුළත් කරගත් හෙයින් ද, උතුරු මැද පළාතේ සිවිල් ආරක්ෂක නිලධාරීන් ද ගුරු සේවයට ඇතුළත් කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

38.

පා.38/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

39.

පා.39/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් නිසා ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

40.

පා.40/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දේශීය කෘෂි නිෂ්පාදනයේ ඉහළ ඵලදායකත්වය සඳහා වන සතුන්ගෙන් සිදුවන වගා හානි වළක්වා ගැනීම හා වගා හානිපූරණය කිරීම,— සුළු පරිමාණ හා ගෙවතු වගා ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාව වගා කරන සාදික්කා, කරාබු, ගම්මිරිස්, පොල්, විවිධ පලතුරු ආදී ස්ථිර බෝග මෙන්ම, අල, ලූණු, එළවළු, වී ආදි කන්න බෝග වගාවන්ට රිලව්, වල් ඌරන්, ඉත්තෑවන්, අලි ආදී විවිධ වන සතුන්ගෙන් සිදුවන හානි වැලැක්වීම සඳහා අදාළ සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ජාතික කෘෂි නිෂ්පාදන ආරක්ෂිත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීමට ද, වන සතුන්ගෙන් සිදුවන වගා හානි සඳහා පූර්ණ වන්දි ලබාදෙන වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට ද, රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

41.

පා.41/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දහම් පාසල් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කිරීම,— දහම් පාසල් අධ්‍යාපනය තුළින් ගුණ දහමෙන් ශික්ෂිත සමාජයක් ගොඩ නැංවීමට පදනම සැකසෙන නමුදු, එම පාසල්වල පවතින භෞතික සම්පත් හිඟය මත ඇතිවෙන දුෂ්කරතා නිසා බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු නොවන හෙයින් රටේ බහුතරයක් දහම් පාසල්වලට අත්‍යවශ්‍ය ඉගෙනුම් මේස, බංකු, ගුරු මේස, ගුරු පුටු, කළු ලෑලි, සුදු ලෑලි මෙන්ම, එහි කුඩා දහම් පුස්තකාල සඳහා පොත් අල්මාරි සපයා දීමටත්, දහම් පාසල් දරුවන් සඳහා ළමා සාරිය, ජාතික ඇඳුම වැනි ඇඳුමක් වෙනුවෙන් අවශ්‍ය රෙදි ලබාදීමටත්, පුද්ගලික අංශයේ හා දානපතීන්ගේ දායකත්වය ද සහිතව රජය විසින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

42.

පා.42/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුවක් හා ආර්ථික නායකත්වයක් ගොඩනැඟීම,— ශ්‍රී ලංකාව තුළ අධික පොළියට ක්‍රියාත්මකවන ක්ෂුද්‍රමූල්‍ය ණය, මූල්‍ය සමාගම් ණය, හා කල්බදු ණය උගුලෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගලවා ගනිමින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නවෝත්පාදන නිෂ්පාදන හා අගය එකතු කරන ව්‍යාපාරවල නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට, කෘෂි නිෂ්පාදකයන්ට හා සේවා සපයන ව්‍යවසායකයන්ට, ලිහිල් කොන්දේසි හා ලිහිල් පොළියකට දිගුකාලීනව ගෙවිය හැකිවන පරිදි මූල්‍ය ණය ලබාදෙන බැංකුවක් ස්ථාපනය කිරීමටත්, රටේ ආර්ථික වර්ධනයට, රැකීරක්ෂා ජනිත කිරීමට හා රටේ සම්පත්වලින් ඉහළම

ඵලදායිකත්වයක් ලබාගැනීමට සහය වන ව්‍යවසායක ආර්ථික නායකත්වයක් ගොඩනැඟීමටත්, දැනට ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය ලබාදෙන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර දේශීය ව්‍යවසායකත්ව සංවර්ධන හා ආර්ථික පුනර්ජීවන කාර්යසාධන බලකායක් ඇති කිරීම උදෙසා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

43.

පා.43/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම,— රටක අනාගතයේ සබුද්ධික පුරවැසියකු බිහිවීමට මුල් ළමාවිය සංවර්ධනය පදනම් වන හෙයින් දිවයිනේ පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා මුල් ළමාවිය මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතියකින් පැවැත්විය යුතු බැවින් ද, එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කර, නිසි ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම නියාමනය කිරීමටත්, ඒවා පවත්වාගෙන යන ව්‍යවසායකයන්ට හා කාර්ය මණ්ඩලවලට ජාතික වෘත්තීය නිපුණතා (NVQ) සහතිකපත් තිබීම අනිවාර්ය කිරීමටත්, එවන් මධ්‍යස්ථානවල පැවතිය යුතු ඉඩකඩ හා යටිතල පහසුකම් පිළිබඳ නිර්දේශ නීතිගත කිරීමටත්, එහි සේවය කරන්නන්ට දායකත්ව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත්, දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එවන් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සහන පොළියට ණය පහසුකම් ලබාදීමටත්, අවශ්‍ය ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට රජය විසින් යෝග්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

44.

පා.44/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි සමුපකාර ව්‍යාපාරයක් බිහිකිරීම,— ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින සමුපකාර ක්‍රමය දැනට අඩ සියවසකට පෙර පත්කරන ලද සමුපකාර ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ අනුව ස්ථාපිත කරන ලද්දක් වන හෙයින් ද, මෙම ව්‍යාපාරය විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි එනම්, ආත්මාධාරය, අන්‍යෝන්‍යාධාරය හා සකසුරුවම යන සමුපකාර මූලධර්ම මත පදනම්ව වත්මන් සියවසේ අභියෝග ජය ගැනීමට සමත්, නව තාක්ෂණය භාවිතයෙන් මහා පරිමාණ වෙළෙඳ ජාල සමඟ සාර්ථකව තරඟ කළ හැකි ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයටත්, ප්‍රාග්ධන ගැටලුව සහ වෙළෙඳපොළ ගැටලුවලට සාර්ථක විකල්පයක් ලෙසත්, අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයටත් යොදාගත හැකි සුවිශාල වත්කම් ප්‍රමාණයක් හිමි ක්ෂේත්‍රයක් වන හෙයින් ද, වත්මන් සමුපකාර ක්‍රමය ඉහත කී අභිප්‍රායන් සංවර්ධනය කිරීම සඳහා අදාළ නව ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට, සමුපකාර ව්‍යාපාරයේ සැබෑ හිමිකරුවන් වන සමුපකාර කොටස් හිමිකරුවන්ගේ බලය වැඩිකර සමුපකාර ව්‍යාපාරය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක්කිරීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

45.

පා.45/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— කාන්තා අයිතීන් සුරැකීම හා කාන්තා අභිවෘද්ධිය සැලසීම,— කාන්තාවන්ගේ කායික, මානසික, සාමාජීය සුරක්ෂිතභාවය හා අභිවෘද්ධිය සැලසීම රටේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයක් වන හෙයින්, කාන්තාවන්ට නිසිලෙස නොසැළකීමට එරෙහිව නඩු විභාගයකින් දඬුවම් පැමිණවීමටත්, කාන්තා හිංසනය, අපයෝජනය, බාලවයස්කාර දැරියන් හෝ කාන්තාවන් දූෂණය කිරීම සම්බන්ධයෙන්

ඇප ලබා නොදෙන නීති පැනවීමටත්, පොලිසියේ කාන්තා හා ළමා අංශයේ බලතල පුළුල් කිරීමටත්, නඩත්තු හා දික්කසාද නඩු අප්‍රමාදව විසඳීමට යෝග්‍ය අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමටත්, බස් රථවල කාන්තාවන් සඳහා එක් පසක අසුන් පෙළක් වෙන් කිරීමටත්, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල සූරාකෑමට හසුවන්නන්ගේ ණය කපා හැරීමට නීති පැනවීමටත්, සෑම නිවසකටම ජලය සහ ඉවුම් පිහුම් සඳහා අඩුවියදම් බලශක්තිය සහතික කිරීමටත්, මුළුතැන්ගෙයි උපකරණ සහන පොළියට ගැනීමට බැංකු පහසුකම් ලබාදීමටත්, වැන්දඹු කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයා ලබමින් සිටි වැටුප ගෙවීම නීතිගත කිරීමටත්, විරැකියා වැන්දඹුවන්ට රජයෙන් යැපුම් දීමනාවක් ලබාදීමටත්, සමාන සේවයට සමාන වැටුප් ලබාදීම නීතිගත කිරීමට හා කාන්තා නිෂ්පාදන අලෙවියට සුදුසු අලෙවි ජාලයක් ගොඩනැඟීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීති අණපනත් සැදීම සඳහා රජය විසින් කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

46.

පා.46/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉහළ නැංවීම,— මැණික් ඉඩම් හඳුනාගැනීමේ සිට මැණික් වෙළෙඳපොළ අලෙවිය දක්වා කටයුතුවලට විවිධ පාර්ශ්ව සම්බන්ධවීම හා නොයෙකුත් ව්‍යුහයන් ක්‍රියාත්මකවීම සිදුවුවත්, ඒවා අතර අන්තර් සබඳතාවයක් නොමැතිවීම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රගතියට හා සංවර්ධනයට මහත් බාධාවක් වන හෙයින්, මෙම කර්මාන්තයට අදාළ ජාතික ප්‍රමුඛතා ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර, කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට අදාළ අන්තර් සබඳතාවය ගොඩනැංවීමටත්, අගය එකතුකරන ලද මැණික් හෝ මැණික් යොදාගත් නිෂ්පාදන දිරිගැන්වීමට බදු සහන ඇතුලු සානුබල ලබාදීමටත්, මැණික් කර්මාන්තයේ නියැලෙන පතල්කරුවන්ගේ ජීවිත අවදානමට මෙන්ම, පතල් මඟින් පරිසරයට සිදුවන හානි පූර්ණය කිරීම සඳහා රක්ෂණ ආවරණයක් ඇතිකිරීමටත්, කැණීම් බලපත්‍රයක් ලබාගැනීම පූර්ණ කොන්දේසියක් ලෙස නීතිගත කිරීමටත්, මැණික් ලාභීන්ට ලැබෙන මුදල් ප්‍රති ආයෝජනය කිරීමට අවස්ථා පුළුල් කිරීමටත්, මැණික් මිලදීගැනීමට පැමිණෙන විදේශිකයන්ට පණවන සීමා ඉවත් කිරීමටත්, මැණික් භාවිතා කර අත්කම් නිෂ්පාදන ඇතුළු ගෘහ කර්මාන්තය දක්වා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමටත්, අලෙවිකරණය දක්වා සියලු ක්ෂේත්‍රවලදී නව තාක්ෂණය යොදාගැනීමටත් යෝග්‍ය ප්‍රතිපත්ති සහ අණපනත් සැදීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

47.

පා.47/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු අපනයන බෝග ආර්ථික මධ්‍යස්ථානයක් ඇතුළත් අපනයන කෘෂි බෝග ආශ්‍රිත නවෝත්පාදන කර්මාන්ත කලාපයක් බිහිකිරීම,— අතීතයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සුළු අපනයන බෝගවලට උරුමව පැවති “සිලෝන් ස්පයිස්” යන කීර්ති නාමය යළි ගොඩනඟා ගනිමින් ගෝලීය වෙළෙඳපොළ ජය ගැනීමට සුළු අපනයන බෝග බහුලව නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක පදනම් කරගත් ආර්ථික මධ්‍යස්ථාන ඇතුළත් එම බෝග ආශ්‍රිත අගය එකතු කරන ලද නවෝත්පාදන කර්මාන්ත කලාප බිහි කරන ලෙසත්, මෙම අපනයන නිෂ්පාදන සඳහා දැනට ක්‍රියාත්මක බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කර අපනයන කෘෂි බෝග කර්මාන්තයේ ප්‍රගමනයට අදාළ බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලෙසත්, සුළු අපනයන බෝග වගාකරුවන් දිරිගැන්වීමට සහනයක් ලෙස අස්වනු අලෙවියෙන් පසු ගෙවීමේ ක්‍රමයට ණය පහසුකම් ලබාදීම සහ ඒ සමඟම වගා රක්ෂණයක් ගොවිමහතුන්ට ලබාදීමේ ක්‍රමෝපායක් ඇතිකිරීමටත් රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

48.

පා.48/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— උඩරට නැටුම්, සම්ප්‍රදායික කලා ශිල්ප, ලී කැටයම්, මූර්ති හා ගෘහ නිර්මාණ ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම,— ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය සහ අනන්‍යතාවය විදහාපාන සාම්ප්‍රදායික උඩරට නැටුම් හා කලා ශිල්ප, චිත්‍ර, ලී කැටයම්, මූර්ති සහ ගෘහ නිර්මාණ ශිල්පය අප රටට පමණක් උරුම ඒක දේශීය විරල සංස්කෘතික හා කලා ශිල්ප වන හෙයින්, ඒවා ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, එකී උරුමයන් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමටත්, එම කලා ශිල්ප ආරක්ෂා කරමින් පවත්වාගෙන යන ශිල්පීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය ඇතිකිරීමටත්, උඩරට උරුමයන් ආරක්ෂා කොට, ප්‍රවර්ධනය කර, විධිමත් ලෙස පාලනය කිරීමට ව්‍යවස්ථාපිත පදනමක් හෝ මණ්ඩලයක් ස්ථාපිත කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

49.

පා.49/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ශ්‍රී ලංකාවේ විදේශ සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමෙන් 8%ක් පමණ දායකත්වයක් විදේශගත ශ්‍රම බලකායෙන් ලැබෙන හෙයින්, එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට විදේශීය ශ්‍රම ඉල්ලුමට සමගාමීව ශ්‍රමිකයන් පුහුණු කරන ආයතනයක් ස්ථාපිත කිරීමටත්, විදේශගත පුරවැසියන්ට ඡන්ද බලය භාවිත කිරීමට අවස්ථාව සලසාදීමටත්, ඔවුන්ට දායක විශ්‍රාම වැටුපක් වැනි සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටත්, විදේශ සේවය හේතු කොට ගෙන ඇතිවන නොවැළැක්විය හැකි දුර්භාග්‍ය අවස්ථාවල දී මෙන්ම අනතුරු විපත්වල දී වන්දි ලබාදෙන රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ඔවුන්ගේ ඉතුරුම්වලට වැඩි පොලියක් බැංකු මඟින් ලබාදීමටත්, නිවාස ඉදිකර ගැනීමට සහන පොලී සහ ණය ලබාදීමටත්, රජයේ රැකියා ලබාදීමේ දී විදේශගත දෙමාපියන්ගේ දරුවන්ට ප්‍රමුඛත්වයක් ලබාදීමටත්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් සහ මෙරට හා විදේශීය රැකියා ඒජන්සිවලින් සිදුවන අකටයුතුකම් කඩිනමින් විසඳීමට යෝග්‍ය ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ශ්‍රමිකයන් ලියාපදිංචියේ දී අයකරන ගාස්තු වලින් හා ගෘහ සේවයට පිටත්වීමේ දී ඒජන්සි ලබාදෙන මුදලින් කොටසක් ලබාගෙන පෙර විගමනික හා පසු විගමනික භාරයක් ඇති කිරීම සඳහාත් රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

50.

පා.50/2020

ගරු එච්. නන්දසේන මහතා,— වසර 40කට අධික කාලයක් පුරා ස්ථිර නිවාසවල පදිංචිව සිටින (බලපත්‍ර සහිත හෝ රහිත) පදිංචිකරුවන් සඳහා ඉඩම්වල අයිතිය ලබාදීම,— වසර 40කට අධික කාලයක් ස්ථිර නිවාස ඉදිකර ගනිමින් පදිංචිව සිටිය දී පසුකාලීනව වනජීවී ප්‍රදේශ ලෙස ගැසට් කිරීම හෝ ජනතාව දැනුවත්කිරීම නිසා ජයභූමි ඔප්පු හෝ වෙනත් දීමනා පත්‍ර ලැබී තිබුණ ද, සියලුම සංවර්ධන කටයුතු අත්හිටුවීම නිසා පදවිය - කැබිතිගොල්ලෑව මාර්ගයේ නිවාස, නගරය හා මූලික රෝහල් භූමිය සහ මිහින්තලය අංක 564 පොතාන තුලානේ නිවාස, සින්නක්කර හෝ පිඹුර සහිත කුඹුරු ඉඩම් හිමි පදිංචිකරුවන්ට තදබල අසාධාරණයක් සිදු වී ඇති හෙයින්, මෙම ඉඩම් නිදහස් කර දීමට අවශ්‍ය කටයුතු රජය විසින් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

51.

පා.51/2020

ගරු එච්. නන්දසේන මහතා,— උතුරු මැද පළාතේ සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම,— මූලය හඳුනා නොගත් වකුගඩු රෝගීන් බහුල ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති උතුරු මැද පළාත තුළ වර්තමානය වනවිට ජල පෙරණ සවිකරමින් තිබෙන හෙයින් ද, එනිසා වැඩිවන රෝගීන් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවක් දක්නට ඇති හෙයින් ද, සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම කඩිනම් කිරීමේ වැඩපිළිවෙළක් රජය විසින් ඇති කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

52.

පා.52/2020

ගරු එච්. නන්දසේන මහතා,— සියලුම ගම්මාන සඳහා ඇති ප්‍රධාන පිවිසුම් මාර්ග ස්ථිර මාර්ග ලෙස සංවර්ධනය කිරීම,— දුෂ්කර ප්‍රදේශවල බොහෝ ගම්මාන සඳහා ඇත්තේ එකම පිවිසුම් මාර්ගයක් පමණක් හෙයින් ද, වසර ගණනාවකින් ඒවා සංවර්ධනය කර නොමැති හෙයින් ද, මෙම සියලුම පිවිසුම් මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

53.

පා.53/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— කටුවැල් බටු දේශීය වශයෙන් වගා කිරීම,— පසුගිය වසර කිහිපය තුළ කටුවැල් බටු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට ඇදී ගිය හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා දේශීය වශයෙන් කටුවැල් බටු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

54.

පා.54/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— ඉඟුරු වගාව ප්‍රවර්ධනය කිරීම,— පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවට ඉඟුරු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී ගිය හෙයින් මෙරටින් විදේශ රටවලට විශාල වශයෙන් ධනය ගලායාම වැළැක්වීම සඳහා ද, ඉඟුරු වගාව දේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද, කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

55.

පා.55/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

56.

පා.56/2021

ගරු රෝහණ බංඩාර මහතා,— දේශීය බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පණගැන්වීම,— වර්තමානය වනවිට දේශීය බීජ නිෂ්පාදනය විදේශීය සමාගම්වල ග්‍රහණයට හසු වී තිබෙන හෙයින් ද, එමඟින් දේශීය කෘෂි කර්මාන්තයට අහිතකර ප්‍රතිඵල අත් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

57.

පා.57/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම,— රටක අනාගත පරපුරට එම රටේ ඉතිහාසය ඉතා වැදගත් වන හෙයින් ද, වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන්ට සිදු වන හානි සම්බන්ධ සිදුවීම් රාශියක් වාර්තා වී ඇති හෙයින් ද, අනාගත පරපුර වෙනුවෙන් වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

58.

පා.58/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම,— වයඹ පළාතේ සැළකිය යුතු පිරිසක් කෘෂි කර්මාන්තයේ නිරත වන හෙයින් ඔවුන්ගේ හෙට දවසේ සුරක්ෂිතතාවය සඳහා අමිල සම්පතක් වන එම පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

59.

පා.59/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— එල්ලේ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— එල්ලේ ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ ක්‍රීඩාව වන හෙයින් එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

60.

පා.60/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ක්‍රීඩා සංගම්වල කටයුතු විධිමත් කිරීම,— වර්තමානය වනවිට ක්‍රීඩා සංගම්වල නිලතල දරන පුද්ගලයන් ක්‍රීඩාවේ ප්‍රගමනයට කටයුතු කිරීම පසෙක දමා සිය පෞද්ගලික අරමුණු සඳහා කටයුතු කරන හෙයින් ක්‍රීඩා සංගම්වල කටයුතු නිරන්තරයෙන් විමර්ශනයට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

61.

පා.61/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නගරවලින් පිටතට බන්ධනාගාර රැගෙන යාම,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ බොහෝ බන්ධනාගාර නගර ආශ්‍රිතව පිහිටා තිබෙන හෙයින් ද, ඒවා තුළ දැඩි තදබදයක් පවතින හෙයින් ද, මෙම බන්ධනාගාර නගරවලින් පිටතට රැගෙන ගොස්, එම පරිශ්‍රවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

62.

පා.62/2021

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා,— (222 අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ සාදන ලද නියෝග අවලංගු කිරීම,— (222 අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 සහ 3 වගන්ති යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය විසින් සාදන ලදුව, 2020 අප්‍රේල් 11 දිනැති අංක 2170/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග අවලංගු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

63.

පා.63/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— අනුරාධපුර නගරයේ ප්‍රධාන පාසලක් නව ජාතික ආදර්ශ පාසලක් බවට පත්කිරීම,— ශ්‍රී ලංකාවේ වාසය කරන ජන වර්ග අතර ජාතික ඒකාබද්ධතාවය ගොඩනැංවීම සඳහා සෑම ජන වර්ගයකම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට භාෂාත්‍රයෙන් අධ්‍යාපනය ලැබිය හැකිවන පරිදි නේවාසික පහසුකම් ද සහිතව අනුරාධපුර නගරයේ ප්‍රධාන පාසලක් සංවර්ධනය කර නව ආදර්ශ ජාතික පාසලක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

64.

පා.64/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— මන්නාරම-අනුරාධපුර මාර්ගය සංවර්ධනය කොට යළි විවෘත කිරීම,— තිස් අවුරුදු යුද සමයේ දී වසා දැමුණු අනුරාධපුර සිට ඇලයාපත්තුව, පේමඩුව, මන්නාරම් හංදිය, සිලාවතුර සහ මන්නාරම දක්වා දිවෙන අබලන් තත්ත්වයේ පවතින ප්‍රධාන මාර්ගය, මන්නාරම සිට භාණ්ඩ සහ මාළු ප්‍රවාහනයට ද, ගමනාගමනයට මෙන්ම කොළඹ ඇතුළු ප්‍රධාන නගර සියල්ලටම ළඟාවිය හැකි පහසුම සහ කෙටිම මාර්ගය වන හෙයින් ද, අනුරාධපුර හා මන්නාරම දිස්ත්‍රික්ක අතර ඍජු සබඳතා මෙන්ම ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කරන හෙයින් ද, මේ සම්බන්ධව පුළුල් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකොට මාර්ගය සංවර්ධනය කර කඩිනමින් යළි විවෘත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

65.

පා.65/2021

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

66.

පා.66/2021

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

67.

පා.67/2021

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි තේ කර්මාන්ත ක්‍රමය වෙනුවට කුඩා තේ වතු ක්‍රමයක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ තේ වගාව, වැවිලි ක්‍රමයට අයත් තේ වතු හා කුඩා තේ වතු ක්‍රමයට අයත් තේ වතු ලෙස දෙයාකාර වන හෙයින් ද, මින් වැවිලි ක්‍රමය මේ වන විටත් බිඳවැටෙමින් පවතින හෙයින් ද, වතු වැවිලි ක්‍රමය මඟින් සිදු කරන තේ වගාව, කුඩා තේ වතු ක්‍රමය දක්වා වෙනස් කොට එම වතුවල සේවය කරන කම්කරුවන්, කුඩා තේ වතුවල හිමිකරුවන් බවට පත් කොට ඒවා දියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

68.

පා.68/2021

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

69.

පා.69/2021

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

70.

පා.70/2021

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

71.

පා.71/2021

ගරු කිංස් නෙල්සන් මහතා,— මහවැලි ගොවිපොළ ජාලය ශක්තිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ දියුණුව උදෙසා දැවැන්ත ජවයක් ලබා දෙන මහවැලි යෝජනා ක්‍රමය මඟින් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින ගොවිපොළ රජය විසින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

72.

පා.73/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— කුඩාවිලච්චිය වැව කඩිනමින් සංවර්ධනය කර මහවිලච්චිය, තන්තිරිමලය, ඇලයපත්තුව, නොච්චියාගම ආදී ප්‍රදේශවලට පානීය ජලය ලබාදීම,— අනුරාධපුර දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රදේශයක් වන මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ මහවිලච්චිය ගොවි ව්‍යාපාරය හැර තන්තිරිමලය, දුණුමඩලාව, කඳුරුපිටිය වැනි ප්‍රදේශ ප්‍රධාන වශයෙන් අහස් දියෙන් හේන් ගොවිතැන් කරන හෙයින් ද, පිරිසිදු පානීය ජලය නොමැතිවීම හේතුවෙන් කුඩා දරුවන් පවා වකුගඩු රෝග සහ වෙනත් රෝග ගණනාවකට ගොදුරු වී ඇති හෙයින් ද, මෙම තත්ත්වයට විසඳුමක් ලෙස ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ඒකාබද්ධව සැලසුම් කර ඇති "විසල් අනුරාධපුර උතුර" හා "විසල් ත්‍රිකුණාමලය" ජල සම්පාදන ව්‍යාපෘති සඳහා මෙතෙක් අනුමතිය ලැබී නොමැති හෙයින් ද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි කුඩාවිලච්චිය වැව සංවර්ධනය කිරීම මඟින් මෙම ජල සම්පාදන ව්‍යාපෘතියට අවශ්‍ය ජලය ලබාගත හැකි හෙයින් ද, කුඩාවිලච්චිය වැව කඩිනමින් සංවර්ධනය කර මහවිලච්චිය, තන්තිරිමලය, ඇලයපත්තුව, නොච්චියාගම ආදී ප්‍රදේශවලට පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතියක් රජය විසින් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

73.

පා.74/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— හබරණ නගරය කේන්ද්‍රීය සංචාරක කලාපය සංවර්ධනය කිරීම,— ලොව පුරා සංචාරක ආකර්ෂණය දිනාගත් සුප්‍රසිද්ධ හබරණ නගරයේ ප්‍රධාන සංචාරක නැරඹුම් ස්ථාන ලෙස මින්නේරිය, රිටිගල හා හබරණ වනාන්තරය හැඳින්විය හැකි හෙයින් ද, මෙහිදී වන අලින් නැරඹීමේ අවස්ථාව උදාවීම සංචාරක ආකර්ෂණයට ප්‍රධානතම හේතුවක් වන හෙයින් ද, සංචාරක කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍රයන් එනම් හෝටල් සහ නවාතැන් පහසුකම්, නිවෙස්වල නතරවීම්, සෆාරි, විවිධ වෙළඳාම්, ත්‍රිරෝද රථ සේවය යනාදිය තම ජීවනෝපාය කරගත් පවුල් 15000ක, 35000ක් පමණ වන ජනතාවක් මෙම ප්‍රදේශයේ වාසය කරන හෙයින් ද, අප රටට විශාල විදේශ විනිමයක් මෙම කර්මාන්තයෙන් උපයාගත හැකිවන හෙයින් ද, හබරණ නගරය කේන්ද්‍රීය සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා උතුරු මැද පළාත් සභාව සම්බන්ධ කොටගත් ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් රජය විසින් ආරම්භ කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

74.

පා.75/2021

ගරු රෝහණ බංඩාර මහතා,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ලබාදීම,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්වී සිටින හෙයින්, මෙම සේවයේ නියුතු නිලධාරීන් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

75.

පා.76/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ දුෂ්කරතා සොයා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයෙකු පත්කිරීම,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විදේශ රටවල දී විවිධ දුෂ්කරතාවලට මුහුණපාන හෙයින් ද, මෙම ශ්‍රමිකයින්ට එම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින් ඉතා අල්ප සේවාවක් සිදුවන හෙයින් ද, ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන්ගේ දුෂ්කරතා සොයා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයෙකු (දුක්ගන්නාරාල කෙනෙකු) රජය විසින් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

76.

පා.77/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ආනවිළුන්දාව තෙත් බිම ආරක්ෂා කිරීම,— ජාත්‍යන්තර රැම්සා සම්මුතිය මඟින් තෙත් බිමක් වශයෙන් නම් කර තිබෙන ආනවිළුන්දාව තෙත් බිම අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

77.

පා.78/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම,— පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා විශාල මෙහෙයක් ඉටු කරනු ලබන පුත්තලම දිස්ත්‍රික්කයේ කඩොලාන පරිසර පද්ධතිය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීමට රජය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

78.

පා.79/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකික විදේශ ශ්‍රමිකයන් සිය නිවෙස්වල නිරෝධායනයට ලක්කිරීම,— කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විදේශයන්හි සිය රැකියා අහිමි වී ඉතාමත් දුක්ඛිත කාල පරිච්ඡේදයක් ගත කර මෙරටට පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරෝධායනය කිරීම සඳහා රජය විසින් හඳුන්වා දී ඇති ක්‍රමවේදය මෙම අවස්ථාවේ දී ඔවුන්ට දැරිය නොහැකි වැය බරක් වන හෙයින් නියමිත කාල සීමාව තුළ සිය නිවෙස්වල නිරෝධායනය වීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

79.

පා.80/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— අනුරාධපුර, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය සංවර්ධනය කිරීම,— අතීතයේ සිට සිංහල, දෙමළ හා මුස්ලිම් ඇතුළු විවිධ ජන කොටස් අනුරාධපුර නගරයේ වාසය කර ඇති හෙයින් ද, 1983 කළු ජූලිය ඇතුළු විනාශකාරි තත්ත්වයන් හේතුවෙන් අනුරාධපුර නගරාසන්නයේ ජීවත් වූ දෙමළ ජනතාවගෙන් බොහෝ පිරිසක් නගරය අත්හැර ගොස් තිබුණද ඔවුන්ගේ අයිතීන් එලෙසින්ම පැවතිය යුතු වන හෙයින් ද, දමිළ දරු දැරියන් වෙනුවෙන් වෙන් වූ අනුරාධපුර, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය මේ වනවිට අභාවයට යමින් පවතින හෙයින් ද, අනෙකුත් ජන කොට්ඨාස සඳහා වෙන් වූ පාසැල් පවතින්නා සේම දමිළ දරු දැරියන් වෙනුවෙන් අනුරාධපුර, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය සංවර්ධනය කිරීමට අවශ්‍ය තීරණ රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

80.

පා.81/2021

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,— රජයේ ලියාපදිංචි කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම,— චිත්‍රපට, ටෙලිනාට්‍ය, වේදිකා නාට්‍ය, සංගීත ක්ෂේත්‍රය යනාදී සියලුම කලා ක්ෂේත්‍ර නියෝජනය කරන ශ්‍රී ලාංකික කලාකරුවන් තම ශ්‍රමය, කාලය සහ හැකියාව වෙනත් රටවලට සාපේක්ෂව ඉතා අඩු මුදලකට ලබාදෙන හෙයින් ද, තම ජීවිතයේ අවසාන කාලය බොහෝ කලාකරුවන් ඉතා දුක්ඛිත, අසරණ සහ අවාසනාවන්ත ලෙස නිමා කරන හෙයින් ද, ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන රජයේ වැටුප් නොලබන බොහෝ කණ්ඩායම්වලට එනම් ගොවි විශ්‍රාම වැටුප, ධීවර විශ්‍රාම වැටුප ලබාදෙන ආකාරයට සිනමා කෘති 10 කට වඩා ස්වකීය දායකත්වය ලබාදුන් හෝ වයස අවුරුදු 60 ඉක්ම වූ රංගන ශිල්පීන්, අධ්‍යක්ෂකවරුන්, කැමරා ශිල්පීන්, සහාය අධ්‍යක්ෂකවරුන්, අංග රචනා ශිල්පීන් ද ඇතුළත් වන පරිදි විශ්‍රාම වැටුපක් සහිත සමාජ ආරක්ෂණ ක්‍රමයක් කලාකරුවන්ට ද ලබාදීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

81.

පා.82/2021

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— නැගෙනහිර පළාතේ ස්ථාපිත කර තිබෙන හා විවෘත කිරීමට නියමිත බැටික්ලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් රජයට පවරා ගැනීම,— බැටික්ලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කිසිදු අනුමතියක් ලබාගෙන නොමැති හෙයින් ද, මෙහි ෂරියා නීතිය සම්බන්ධ පාඨමාලා ඉගැන්වීම ඔස්සේ අන්තවාදී මත දරන්නන් බිහිවිය හැකි හෙයින් ද, මෙරට ජාතීන් හෝ ආගම් වෙන්කර විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම හරහා රට බෙදුම්වාදය කරා යොමුවීමේ හැකියාවක් ඇති හෙයින් ද, ආයතනය සම්බන්ධයෙන් පසුගිය පාර්ලිමේන්තුවේ පැවති අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා නිරීක්ෂණ වාර්තාවේ ඒකමතික අවසන් නිර්දේශ අනුව මෙම නීති විරෝධී ආයතනය රජයට පවරා ගත යුතු බව සහ සියලු වැරදිකරුවන්ට කඩිනම් නීතිමය පියවර ගත යුතු බව දක්වා ඇති හෙයින් ද, මෙම ආයතනය රජයට පවරාගෙන එහි මෙරට ජීවත්වන සියලුම ජනවර්ගයන්ට හා ආගම්වලට අයත් දරුවන් හට උසස් අධ්‍යාපනය හැදෑරීමට අවකාශ ලබාදීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

82.

පා.83/2021

ගරු මයන්ත දිසානායක මහතා,— බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය මැතිවරණ බල ප්‍රදේශයේ අලි-මිනිස් ගැටුම් සහ වන අලින් විසින් සිදුකරන වගා හානි වැළැක්වීම,— ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය මැතිවරණ බලප්‍රදේශයේ, මහවැලි ගම්මාන වන අගලඔය, මිල්ලන්නාව, විරානගම සහ තවත් මහවැලි ගම්මාන කිහිපයක වන අලි තර්ජනය හේතුවෙන් ඉතා වෙහෙස මහන්සියෙන් වගා කළ වගාවන් විනාශවන හෙයින් ද, අවාසනාවන්ත ලෙස ජීවිත අහිමිවන හෙයින් ද, මෙම තත්ත්වයෙන් ඔවුන්ව මුදා ගැනීමට ස්ථිරසාර විසඳුමක් ලබාදීමට හෝ අලි වැටක් සකස් කරදීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

83.

පා.84/2021

ගරු මයන්ත දිසානායක මහතා,— සියලුම දරුවන් සඳහා දහම් පාසැල් අධ්‍යාපනය ලබාදීම,— බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු නොවීමෙන් ශිෂ්ට සම්පන්න සමාජයක් වෙනුවට අපචාර සහ අපරාධ පිරුණු සමාජයක් බිහිවීමට ඉඩ ඇති හෙයින් දහම් පාසැල් දිනයේ දී උපකාරක පන්ති නවතා දහම් පාසැල් අධ්‍යාපනය අනිවාර්යය කිරීමට ද, දුෂ්කර ප්‍රදේශවල දහම් පාසැල් සඳහා භෞතික සම්පත් ලබාදීමට මෙන්ම දහම් පාසැල් ගුරුවරුන්ගේ සුබසාධනය සඳහා ද, රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

84.

පා.85/2021

ගරු මයන්ත දිසානායක මහතා,— ත්‍රිරෝද රථ සහ යතුරු පැදි ආශ්‍රිත රැකියා නියුක්තිකයන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම,— ශ්‍රී ලංකාව තුළ ත්‍රිරෝද රථ සහ යතුරු පැදි ආශ්‍රිතව ඍජු සහ වක්‍ර රැකියාවල නියුතු ස්වයං රැකියාලාභීන් හට කොවිඩ් - 19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන ලබා දුන් ණය සහන වාරිකයට ඉහළ පොළී අනුපාතයක් අය කිරීම හේතුවෙන් ඔවුන් ඉමහත් දුෂ්කරතාවලට මුහුණ දී ඇති හෙයින් ඔවුන්ගේ ජීවන තත්ත්වය සහ රැකියාව සුරක්ෂිත කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

85.

පා.86/2021

ගරු රෝහණ දිසානායක මහතා,— එළවළු මිලදී ගැනීමේ හා අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තක්කාලි ඇතුළු එළවළු වගාව විශාල වශයෙන් සිදු කරනු ලබන කෘෂිකාර්මික ප්‍රදේශයක් වන හෙයින් ද, එම නිෂ්පාදන එක්රැස් කොට තොග වශයෙන් අළෙවි කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති හෙයින් ද, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යේලක්කරය මංසන්ධියේ සිට මාතලේ කුරුණෑගල මාර්ගයේ දකුණු පස පිහිටි භූමිය නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන එහි එළවළු එකතු කිරීමේ හා අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට රජය විසින් කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

86.

පා.87/2021

ගරු රෝහණ දිසානායක මහතා,— අලි - මිනිස් ගැටුම වළක්වාලීම,— අලි - මිනිස් ගැටුම හේතුවෙන් වනඅලින්ගේ ජීවිතවලටත්, මිනිස් ජීවිතවලට හා ඔවුන්ගේ දේපළවලටත් හානි සිදුවන දිස්ත්‍රික්ක අතරට මාතලේ දිස්ත්‍රික්කය ද අයත් වන අතර මෙම ගැටලුවට විසඳුමක් ලෙස අලිවැටවල් ඉදිකර තිබුනද ගැටලුව විසඳී නොමැති හෙයින් වන උද්‍යාන වශයෙන් නිශ්චිතව හඳුනාගත් ප්‍රදේශ වෙන්කර සියලුම වනඅලින් අල්ලා ඒවාට මුදා හැරීමට ද, එම වන උද්‍යාන වටා විදුලි වැටවල් වෙනුවට පස් බැම් ඉදිකර ඒ මත මාර්ග ඉදිකිරීමට, ශාක වගාකිරීමට හා සංචාරක මධ්‍යස්ථාන ඉදිකිරීමට ද, ලංකාවේ අනෙක් ප්‍රදේශවල ඉදිකර ඇති විදුලි වැටවල් ගලවා ඉවත්කිරීමට ද සහ ඉහත සඳහන් වන උද්‍යාන ඇතුළත වැව් ඉදිකර ඒවාට වාරි ජලය සැපයීමට ද අවශ්‍ය කටයුතු රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

87.

පා.88/2021

ගරු රෝහණ දිසානායක මහතා,— වන සංරක්ෂණ හා වනජීවී ඉඩම්වලට ගවයන් මුදා හැරීම වැළැක්වීම,— වනජීවී දෙපාර්තමේන්තුවට හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත ඉඩම්වලට ආහාර සඳහා ගවයන් මුදාහැරීම හේතුවෙන් ගොවීන් සහ වනජීවී නිලධාරින් අතර ගැටලු බොහොමයක් නිර්මාණය වී ඇති හෙයින් ද, මේ සඳහා මෙම ඉඩම්වල පිහිටා ඇති විශාල වෘක්ෂ එලෙසම පවතිද්දී ඉඩම්වලින් කොටසක් ගව පාලනය සඳහා වෙන්කර ඒවායේ වැව් ඉදිකර වාරි ජලය ද සැපයීමෙන් නිරන්තරයෙන් වනඅලින්ගෙන් බැටකන ගොවීන්ව කිරි ගව පාලනයට යොමු කළ හැකි හෙයින් ද, එයින් පරිසර පද්ධතියට කිසිදු හානියක් නොවන හෙයින් ද, එමඟින් කිරි සඳහා වාර්ෂිකව විශාල ධනස්කන්ධයක් විදේශ රටවලට ගලායාම වළක්වාගත හැකි හෙයින් ද, කිරි නිෂ්පාදනය හේතුවෙන් රටේ විශාල ආර්ථික ප්‍රගතියක් ඇතිකර ගැනීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

88.

පා.89/2021

ගරු රෝහණ දිසානායක මහතා,— රිලවුන්ගෙන් හා වඳුරන්ගෙන් සිදුවන හානි වළක්වා ගැනීම,— නිදැල්ලේ හැසිරෙන රිලවුන් හා වඳුරන් නිසා ගොවීන්ගේ එළවළු හා පලතුරු වගාවන් මෙන්ම පොල් වගාවන් විනාශවීම, නිවාස හා දේපල විනාශවීම, ලේනුන් හා ගිරවුන් ආදී සතුන්ගේ කුඩු හා බෙන කඩා පැටවුන් හා බිත්තර කා දැමීම, දෙල් ආදී ගස්වල දළු කා දැමීම හේතුවෙන් එලදාව හීනවීම යනාදී ගැටලු රාශියක් උද්ගතව තිබෙන හෙයින් මෙම හානි වළක්වා ගැනීමේ ජාතික අවශ්‍යතාවය සඳහා විසඳුම් ලෙස මොරගහකන්ද වැනි ජලාශ මධ්‍යයේ පවතින දූපත්වලට මෙන්ම වෙරළ ආශ්‍රිතව පවතින දූපත්වලට රිලවුන් හා වඳුරන් මුදාහැරීම, එම ස්ථාන රිලා හා වඳුරු උද්‍යාන ලෙස නම් කිරීම, අල්ලා ගනු ලබන සතුන් වඳභාවයට පත්කර මුදාහැරීම, දඹුල්ල හා මැනිං ආදී ආර්ථික මධ්‍යස්ථානවලින් ඉවතලන එළවළු හා පලතුරු රිලා හා වඳුරු උද්‍යානවලට ලබාදීම සඳහා පරිසර සංවිධාන හරහා වැඩපිළිවෙළක් සැකසීම හා මෙම රිලා හා වඳුරු උද්‍යාන නැරඹීමට සුදුසු වැඩපිළිවෙළක් සකසා ඉන් උපයන මුදල් එම උද්‍යාන නඩත්තු කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

**2021 ජූනි 22 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

26/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් රජයේ ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවාගැනීමට 2020 වර්ෂයේදී ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, ඒ සඳහා අයදුම්පත් යොමු කළ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පුහුණුව සඳහා බඳවාගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුහුණුව සඳහා බඳවාගැනීමේදී මෙම උපාධිධාරීන් බාහිර හා අභ්‍යන්තර උපාධිධාරීන් වශයෙන් වර්ගීකරණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව සහ අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බාහිර උපාධිධාරීන් සඳහා පත්වීම් ලිපි ලබා දීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

277/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ ගස්ලබු නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගස්ලබු නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගස්ලබු ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) ගස්ලබු වගාව සඳහා සුදුසු දේශගුණ තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව ගස්ලබු ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී ගස්ලබු ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව ගස්ලබු අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී ගස්ලබු අපනයන කිරීමෙන් ලැබූ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

494/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුවේ සේවක සංඛ්‍යාව තුල අනුමත සුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන සුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින සුළු සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු සාධාරණව පිරවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

628/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථානවල නම් කවරේද;

(iii) එම එක් එක් වී ගබඩාවේ ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2015 සිට මේ වනතෙක් එම එක් එක් වී ගබඩාවේ ගබඩා කරන ලද වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව හා ඒවා පිහිටි ස්ථානවල නම් කවරේද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයේ වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

722/2020

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිස්ත්‍රික්කයේ ජනතාවට සෞඛ්‍ය සේවා සපයන මන්නාරම දිස්ත්‍රික් රෝහලේ බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ල ඉතා පැරණි බවත්;

(ii) එම රෝහලේ බාහිර රෝගී අංශය සහ දැඩි සත්කාර ඒකකය ඉදිකරන බවට පසු ගිය කාලයේදී පොරොන්දු වුවද, මේ වනතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බොහෝ වෛද්‍ය පරීක්ෂණ එම රෝහලේ සිදු නොකරන බවත්;

(ii) සී.ටී. ස්කෑන් (CT SCAN), ස්නායුවේද (NEUROLOGY), උගුර - කණ - නාසය (ENT), විකලාංග (ORTHOPAEDIC), නියෝප්ලස්මාවේදය (ONCOLOGY), මෞත්‍රික රෝග චිකිත්සාව (UROLOGY), වෘක්කවේදය (NEPHROLOGY), වක්ත්‍ර, මුඛ හා හණුකවේදය (OMF) යන ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මෙම රෝහලේදී සිදු කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ඈ) ඉහත ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මන්නාරම දිස්ත්‍රික් රෝහල තුළ සිදු කිරීම, නැවත ආරම්භ කළ හැකිද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

737/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල්නෑව නගරයේ පිහිටා ඇති බස් නැවතුම්පළ, මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීමත් සමඟ ඉදිකර ඇති බවත්;

(ii) වැසි දිනවලදී එම බස් නැවතුම්පළ මගී ජනතාවට භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම බස් නැවතුම්පළ අලුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

893/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවතින තෙල් පිරිපිහදු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ආරම්භ කරන ලද දිනය හා ඒවායේ ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් තෙල් පිරිපහදුවල අතුරු නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත කවරේද;

(iv) නව තෙල් පරිපහදුවක් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

970/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති මුළු ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(ii) අම්පාර දිස්ත්‍රික්කය තුළ ධීවර වරායන් පිහිටා තිබේද;

(iii) අම්පාර දිස්ත්‍රික්කයේ ධීවර වරායක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථාන පවතින බව දන්නේද;

(iv) පොතුවිල් ප්‍රදේශයේ ධිවර වරායක් ස්ථාපිත කිරීම පිළිබඳව ඉදිරිපත් කරනු ලබන යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා ධීවර සංස්ථාවේ කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය සිය බෙදාහැරීමේ කටයුතු සඳහා මත්ස්‍යයන් ලබා ගනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) එම මත්ස්‍යයන් කල්මුණේ සහ මඩකලපුව යන ප්‍රදේශවලින් හැර වෙනත් ප්‍රදේශවලින් ලබා ගනු ලබන්නේ නම් ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1199/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 අගෝස්තු මාසයේදී බලයට පත්වූ යහපාලන රජය විසින් මිලදී ගනු ලැබූ සමස්ත වී ප්‍රමාණය කිලෝග්‍රෑම්වලින්;

(ii) එම වී කිලෝග්‍රෑම් එකක ගැනුම් මිල;

(iii) එසේ මිලදී ගත් වී ප්‍රමාණයෙන් සත්ව ආහාර සඳහා විකුණා ඇති වී ප්‍රමාණය කිලෝග්‍රෑම්වලින්;

(iv) එම වී කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල;

(v) ඉහත (iii) හි සඳහන් වී ප්‍රමාණය, සත්ව ආහාර සඳහා විකිණීම හේතුවෙන් සිදු වී ඇති අලාභය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1363/2020

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පූජ්‍ය උඩවලවේ අමරවංශ හිමියන් 2008.11.06 දින සිට ර/බෝපිටිය විද්‍යාලයේ උප ගුරුවරයකු ලෙස සේවය කරන ලද බවත්;

(ii) අසත්‍ය අපචාර චෝදනාවක් මත එම හිමියන්ව අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීම හේතුවෙන් එම හිමියන්ගේ වැඩ තහනම් කර සේවය අවසන් කළ බවත්;

(iii) මේ සම්බන්ධ නඩු විභාගයෙන් පූජ්‍ය අමරවංශ හිමියන් නිදොස් කොට නිදහස් වීම හේතුවෙන් සේවය ඛණ්ඩනය වීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා ඇති බවත්;

(iv) එහෙත් එම හිමියන්ට මේ වනතෙක් හිඟ වැටුප් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම හිමියන්ගේ හිඟ වැටුප් ගෙවන්නේද;

(ii) පූජ්‍ය අමරවංශ හිමියන්ට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා විනය නියෝගයක් ලබා දී නොමැති බැවින් එම හිමියන් සමඟ පත්වීම් ලද අනෙකුත් ගුරු සහායකවරුන්ගේ පත්වීම් ස්ථිර කරන ලද දිනය වන 2012.03.31 දින සිට පූජ්‍ය අමරවංශ හිමියන්ගේ පත්වීමද ස්ථිර කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජූනි 23 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

79/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වේච්ඡා ග්‍රාම නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ වසම් අතර ග්‍රාම නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් සිදුකළ හැකි වන්නේද;

(iii) එක් ග්‍රාම නිලධාරිවරයකුට එක් වසමක සේවය කළ හැකි කාලය කොපමණද;

(iv) විශ්‍රාමික ග්‍රාම නිලධාරීන් සම්බන්ධයෙන් රජයේ වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

278/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ දොඩම් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දොඩම් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති දොඩම් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) දොඩම් වගාව සඳහා සුදුසු දේශගුණ තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව දොඩම් ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී දොඩම් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව දොඩම් අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී දොඩම් අපනයන කිරීමෙන් ලබන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

462/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රජයේ ශික්ෂණ රෝහල රජයට පවරා ගනු ලැබූ දිනය කවරේද;

(ii) එම පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ සමස්ත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම රෝහලේ සේවය කරනු ලබන හෙදියන් සඳහා 2017 ඔක්තෝබර් සිට 2020 දෙසැම්බර් දක්වා ගෙවන ලද වැටුප්වල එකතුව කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රජය විසින් එම රෝහලට ඖෂධ සපයන්නේද;

(ii) එසේ නම්, 2017 සැප්තැම්බර් සිට මේ වනතෙක් එම ඖෂධ සැපයීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

498/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිව් ඩයමන්ඩ් නෞකාව අනතුරකට ලක් වූ දිනය කවරේද;

(ii) එම අනතුර හේතුවෙන් ශ්‍රී ලංකාවේ සමුද්‍ර පරිසර පද්ධතියට හානියක් සිදු වී තිබේද;

(iii) එම හානිය සම්බන්ධයෙන් තක්සේරුවක් කර තිබේද;

(iv) එම හානිය සම්බන්ධයෙන් ඉහත සඳහන් නෞකාව හිමි සමාගමෙන් වන්දි අයකර ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

791/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි ගොවිබිම්වල නිදිකුම්බා ශාකය ව්‍යාප්ත වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම නිදිකුම්බා ශාකය ව්‍යාප්තිය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

824/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) මූල්‍ය සහයෝගිතාවය යටතේ ගල්ගමුව දිස්ත්‍රික් රෝහල, මූලික රෝහලක් ලෙස සංවර්ධනය කිරීමේදී පහසුකම් රැසක් ලබා දුන් බවත්;

(ii) ඒ යටතේ එම රෝහලට ලබා දෙන නවීන තාක්ෂණයෙන් සමන්විත ශල්‍යකර්ම යන්ත්‍ර මේ වන තෙක් ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එම රෝහලේ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

850/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ මහවැලි කලාපවල —

(i) මුළු භූමි ප්‍රමාණය;

(ii) වී වගා කර ඇති භූමි ප්‍රමාණය;

(iii) අතිරේක භෝග වගා කර ඇති භූමි ප්‍රමාණය;

(iv) මුඩු බිම් ප්‍රමාණය;

එක් එක් කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ මහවැලි කලාපවල පදිංචි —

(i) මුළු පවුල් ඒකක සංඛ්‍යාව;

(ii) එම සියලු පවුල් ඒකකවල මුළු සාමාජිකයන් සංඛ්‍යාව;

එක් එක් කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

875/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනිකුත් රජයන් සහ බහුපාර්ශ්වික ආයතන ආදිය වෙතින් ණය පමා සහනයක් ඇතුළුව ණය සහනයන් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඉල්ලීම් කිහිපයක් සිදුකර තිබේද ;

(ii) එසේනම්, ණය පමා සහනය ඇතුළුව ණය සහන සඳහා ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා සිදුකර ඇති ඉල්ලීම්වල ස්වභාවය කවරේද:

(iii) ඉහත කී ඉල්ලීම් සිදුකරන ලද දිනය කවරේද;

(iv) ඉහත කී ඉල්ලීම් සඳහා ලැබී ඇති ප්‍රතිචාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රජය වෙත අනුමත ප්‍රදානවලින් ලැබීමට ඉතිරිව ඇති ප්‍රදාන කවරේද;

(ii) ඉහත කී ප්‍රදානයන්ගේ වටිනාකම කොපමණද;

(iii) ශ්‍රී ලංකා රජය විසින් ඉහත කී ප්‍රදානයන් භාරගෙන නොමැත්තේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

9.

1208/2020

ගරු නිමල් පියතිස්ස මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 45ක් වුවද, ඊට පටහැනිව වයස අවුරුදු 45 ඉක්මවූ පුද්ගලයන්ද රාජ්‍ය සේවයට බඳවාගෙන ඇති බවත්;

(ii) එසේ බඳවාගන්නා ලද රාජ්‍ය සේවකයන් කොටසකගේ පත්වීම් ස්ථිර කර, නියමිත වැටුප් හා අදාළ වරප්‍රසාද ලබා දෙන බවත්;

(iii) කොටසකගේ පත්වීම් ස්ථිර නොකර දීමනාවක් පමණක් ලබා දෙන බවත්;

(iv) වයස අවුරුදු 45 ඉක්මවා රාජ්‍ය සේවයට බඳවාගෙන ඇති රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන බවත්;

(v) ඒ හේතුවෙන් රාජ්‍ය සේවකයන් කොටසකට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වයස අවුරුදු 45 ඉක්මවා රාජ්‍ය සේවයට බඳවාගෙන ඇති සියලුම රාජ්‍ය සේවකයන් ස්ථිර කරන්නේද;

(ii) ඔවුන්ට හිමි වැටුප් හා වරප්‍රසාද ලබා දෙන්නේද;

(iii) ඔවුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1276/2020

ගරු තිස්ස අත්තනායක මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී හදිසි සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි චීනයේ කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩල ඉහළ නිලධරයෙකු වන යන්ග් ජියේචි (Yang Jiechi) මහතා ඇතුළු චීන නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා හමුවීමට හේතු කවරේද;

(ii) එම හදිසි සංචාරය තුළින් ශ්‍රී ලංකාවට සහන හා ආධාර ලැබී තිබේද;

(iii) ඉහත හදිසි සංචාරයට අදාළ සුවිශේෂ කරුණක් තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 ජූනි 25 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

80/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රත්නපුර දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරනු ලැබූ සතිපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ සංවර්ධනය කරනු ලැබූ සතිපොළවල නම් කවරේද;

(iii) එම එක් එක් සතිපොළ සංවර්ධනය කිරීම සඳහා වියදම් කරනු ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් සතිපොළ සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පුද්ගලයාගේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

321/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ටේබල් ටෙනිස් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) අංක (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ ටේබල් ටෙනිස් ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටේබල් ටෙනිස් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ටේබල් ටෙනිස් සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

464/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 දී සාලාව යුධ හමුදා කඳවුරේ සිදු වූ පිපිරීමෙන් විනාශ වූ අවි ආයුධවල මූල්‍යමය වටිනාකම;

(ii) එහිදී හමුදා කඳවුරට සිදු වූ හානියේ මූල්‍යමය වටිනාකම;

(iii) එම පිපිරීමෙන් හමුදා කඳවුර අවට පිහිටි වෙළඳසල් සහ නිවාසවලට සිදු වූ හානියේ මූල්‍යමය වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පිපිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණය අනුව ඉහත සඳහන් පිපිරීමට හේතු කවරේද;

(iii) ඉහත පිපිරීමට අදාළ වැරදිකරුවන් අනාවරණය වී තිබේ නම්, ඔවුන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

510/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ වනතෙක් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කටුවැල්බටු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද කටුවැල්බටු ප්‍රමාණය කොපමණද;

(iv) කටුවැල්බටු වගාව ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

806/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධි සේවක පදනම මත දිවයින පුරා පාසල්වල පත්වීම් ලබා දී ඇති විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත තුළ සේවයේ යෙදී සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් විදුහල්පතිවරුන්ට—

(i) පත්වීම් ලබා දෙන ලද දිනය;

(ii) වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා නොදීමට හේතු;

(iii) වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා දෙනු ලබන දින වකවානු;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම විදුහල්පතිවරුන්ව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

(ii) ඔවුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දින වකවානු;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

825/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සියඹලන්ගමුව ප්‍රදේශයේ, වකුගඩු රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා රෝහලක් ඉදිකර ඇති බවත්;

(ii) ගල්ගමුව හා පොල්පිතිගම ප්‍රදේශවල ජීවත්වන විශාල පිරිසක් වකුගඩු රෝගයට ගොදුරු වී ඇති බවත්;

(iii) එහෙත්, ඉහත සඳහන් රෝහල වසර 03ට අධික කාලයක් තිස්සේ වසා දමා ඇති බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) ඉහත සඳහන් රෝහල කඩිනමින් විවෘත කර වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

945/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "ඉටුකම කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(ii) එම අරමුදල පාලනය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(iii) එම අරමුදල පාලනය කිරීම සඳහා රජයේ නිලධාරියකු පත් කර තිබේද;

(iv) එසේ නම්, එම නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අරමුදලේ මේ වනවිට පවතින ශේෂය කොපමණද;

(ii) කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට ඉහත සඳහන් අරමුදලෙන් ලබා දී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඒ සඳහා වියදම් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1080/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 05 කාලය තුළ, පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ මියගිය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) වකුගඩු රෝගය වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය විසින් ක්‍රියාත්මක කරන ලද, වකුගඩු රෝගීන් සඳහා මාසිකව අධාර මුදල් ලබා දීමේ වැඩසටහනට අලුතින් හඳුනාගනු ලැබූ වකුගඩු රෝගීන් ඇතුළත් කර නොමැති බවත්;

(ii) අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක නොවන බවත්;

එතුමිය දන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (i) සහ (ii) හි සඳහන් වැඩසටහන් විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1108/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලගෙදර, මාවතගම (මල්ලවපිටිය) ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය මඟින් ජල සැපයුම් ලබා දීමට අපේක්ෂා කරනු ලබන ආයතන හා නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්වය කවරේද;

(v) ව්‍යාපෘතියේ වැඩ අවසන් කර එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1200/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර මහ රෝහලේ —

(i) අධ්‍යක්ෂවරයා පත් කරන ලද පදනම කවරේද;

(ii) මේ වනවිට සේවය කරනු ලබන වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) වෛද්‍ය නිලධාරි තනතුරෙහි මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට සේවය කරනු ලබන හෙද කාර්යමණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනවිට පවතින හෙද පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර යටතේ අනුරාධපුර මහ රෝහලේ ඉදිකිරීමට සැලසුම් කර තිබූ හෘද රෝග ශල්‍යාගාරයේ;

(ii) ළමා හා මාතෘ සායන සඳහා වන ගොඩනැගිලි සංකීර්ණයේ;

(iii) අංග සම්පූර්ණ හදිසි ප්‍රතිකාර ඒකකයේ;

වර්තමාන තත්ත්වය කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 ජූලි 06 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

90/2020

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැව් තෙල් ආශ්‍රිත විදුලි බලාගාරයක් ස්ථාපිත කර ඇති බවත්;

(ii) එම බලාගාරයේ ක්‍රියාකාරිත්වය හේතුවෙන් දැඩි පරිසර හානියක් සිදු වන බවත්;

(iii) එම බලාගාරය සඳහා පරිසර බලපත්‍ර ලබා දීමේදී, නිසි ක්‍රමවේදය අනුගමනයකර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම බලාගාරය අයත් සමාගමේ නම කවරේද;

(ii) එම සමාගම සමඟ ගිවිසුම්ගත කාල සීමාව කවරේද;

(iii) මෙම විදුලි බලාගාරය මඟින් සිදු වන පරිසර හානිය අවම කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

194/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ක්‍රීඩා සභාව සඳහා පත් කරන ලද නව සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා ඔවුන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂිත සේවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

279/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ පෙයාර්ස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පෙයාර්ස් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති පෙයාර්ස් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) පෙයාර්ස් වගාව සඳහා සුදුසු දේශගුණ තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව පෙයාර්ස් ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී පෙයාර්ස් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව පෙයාර්ස් අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී පෙයාර්ස් අපනයනය කිරීමෙන් ලැබූ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

503/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා 2019.03.29 දිනැති රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරන ලද බවත්;

(ii) එම දැන්වීමට අනුව, 2019 ජූනි මස බඳවා ගැනීමේ තරඟ විභාගයක්, පවත්වා එහි ප්‍රතිඵල මත, තෝරාගන්නා ලද අයදුම්කරුවන් සඳහා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් 2019 නොවැම්බර් මස පවත්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද;

(ආ) (i) ඉහත සඳහන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය මේ දක්වා සිදුකිරීම වෙනුවෙන් රජය විසින් දරා ඇති වියදම කොපමණද;

(ii) මේ වනවිට බන්ධනාගාර නියාමක තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) බන්ධනාගාර නියාමක තනතුර සඳහා පවතින පුරප්පාඩු පිරවීමේදී, ඉහත සඳහන් බඳවා ගැනීමේ පටිපාටිය යටතේ තෝරාගත් අයදුම්කරුවන්ට අවස්ථාව ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම අයදුම්කරුවන්ට පත්වීම ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

826/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "වයඹ සංස්කෘතික චතුරශ්‍ර" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂය වනවිට ඉහත ව්‍යාපෘතියේ සේවය කරන ලද සේවකයන් සංඛ්‍යාව;

(ii) එම ව්‍යාපෘතියේ සේවය කරමින් සිටියදී 2015 වර්ෂයෙන් පසු ඉවත් කරන ලද සේවකයන් සංඛ්‍යාව;

(iii) එම සේවකයන් සේවයෙන් ඉවත් කරන ලද පදනම;

(iv) 2015 වර්ෂයෙන් පසුව බඳවා ගනු ලැබූ සේවකයන් සංඛ්‍යාව;

(v) එම සේවකයන් බඳවා ගනු ලැබූ පදනම;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතියේ සේවය කරන ලද සේවකයන් දේශපාලන හේතූන් මත සේවයෙන් ඉවත් කර ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සේවකයන්ට සාධාරණය ඉටු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

876/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිදහස ලැබුණු දින සිට ණය ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් නොකැළැල් ඉතිහාසයක් පවත්වාගෙන යමින් සිටින ලද බව ශ්‍රී ලංකා රජය විසින් නොකඩවා ප්‍රකාශ කරන ලද බවත්;

(ii) මූඩි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනය විසින් ශ්‍රී ලංකාවේ ණය ආපසු ගෙවීමේ හැකියාව B2 සිට Caa1 දක්වා මට්ටම් දෙකකින් පහත දමා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද ?

(ආ) (i) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ පොලී සහ ක්‍රමක්ෂය ගෙවීම් වල මුළු වටිනාකම කවරේද ;

(ii) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත අයවැය හිඟය කවරේද ;

(iii) 2020 වර්ෂයේ පළමුවන, දෙවන හා තුන්වන කාර්තු සඳහා රජයේ ආදායම කවරේද;

(iv) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ණය ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව විසින් තම ණය ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය වෙත ඇතිවන බලපෑම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

947/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වලුක්කියාරු - අරාලි - වේලනයි - පුංගුඩුතිව් හරහා කුරිකට්ටුවාන් දක්වා දිවෙන මාර්ගය, යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රධාන මාර්ගය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ දිග කොපමණද;

(ii) එම මාර්ගය අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද දිනය කවරේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ප්‍රධාන ප්‍රවාහන මාර්ගයක් වන ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාව දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම මාර්ගය දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(ii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේනම්, ඒ මන්ද?

8.

1020/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශයට අයත්ව තිබූ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් කාල සීමාව තුළ සමූපකාර තොග වෙළඳ සංස්ථාව, සීමාසහිත ලංකා සතොස සහ විවිධ සේවා සමූපකාර සමිති විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳ ආයතන සඳහා අවශ්‍ය වන භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත ආයතන සඳහා භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී විනිවිදභාවයකින් කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, යම් අක්‍රමිකතාවයක් සිදු වී තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පූර්ණ විගණනයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1081/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේදී මේ වනතෙක් වරලත් ඉංජිනේරු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා නොසිටි බවත්;

(ii) එහෙත් ඒ සඳහා මෑතක සිට වරලත් ඉංජිනේරු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා සිටින බවත්;

(iii) එම තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සඳහා රු. 25,000/- වඩා වැඩි මුදලක් වැය කිරීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී, තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා සිටීමේ ක්‍රමවේදය ඉවත් කිරීමට හෝ ඒ සඳහා සහනයක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1201/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කිරි ගවයන් ආනයනය කරන ලද රටවල්වල නම් කවරේද;

(iii) එක් කිරි ගවයකු ආනයනය කිරීම සඳහා වැයකරන ලද මුදල කොපමණද;

(iv) ඒ අනුව, කිරි ගවයන් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කිරි ගවයන් ගාල් කරනු ලැබූ ප්‍රදේශය කවරේද;

(ii) ගොවීන් වෙත ලබා දෙනු ලැබූ කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ජීවිතක්ෂයට පත් වූ කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කිරි ගවයින් ආනයනය කිරීම මඟින් රජයට සිදු වී ඇති අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 ජූලි 07 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

82/2020

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව, මනම්පිටිය ප්‍රදේශයෙන් ගොඩ දමනු ලබන වැලි, අවශ්‍යතාවය අනුව නිකුත් කරනු ලබන්නේ මනම්පිටිය වැලි සමාගම විසින් බව දන්නේද;

(ii) එම සමාගම රජයේ සමාගමක්ද;

(iii) නොඑසේ නම්, අර්ධ හෝ පූර්ණ පෞද්ගලික සමාගමක්ද;

(iv) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(v) ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතාව අනුව එම සමාගම විසින් වැලි නිකුත් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

280/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ වී‍ස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වී‍ස් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2018 හා 2019 වර්ෂවලදී ශ්‍රී ලංකාවට වී‍ස් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව වී‍ස් අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී වී‍ස් අපනයනය කිරීමෙන් ලබන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

314/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ඛනිජ තෙල් ගබඩා කරනු ලබන ස්ථානවල නම් කවරේද;

(ii) එම එක් එක් ස්ථානයේ ගබඩා කළ හැකි ඛනිජ තෙල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඛනිජ තෙල් ගබඩා කරනු ලබන ස්ථාන සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

465/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 හා 2019 දී පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ෂයේදී මුද්‍රණය කරන ලද පෙළපොත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එවකට අධ්‍යාපන අමාත්‍යවරයාගේ වර්ණ ඡායාරූපයක් එම පෙළපොත්වලට ඇතුළත් කර තිබුණේද;

(iv) එසේ නම්, එම ඡායාරූපය එම පෙළපොත්වල මුද්‍රණය කර පළ කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

5.

743/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රත්මල්ගහවැව හන්දියේ සිට කිවුලේකඩ හන්දිය දක්වා වූ කි.මී. 10ක් පමණ දිගින් යුතු මාර්ග කොටස ඉතා අබලන් තත්ත්වයේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එම මාර්ග කොටසේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

941/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා තාක්ෂණ විෂය ධාරාවෙන් පන්ති පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල තාක්ෂණ විෂය ධාරාව ඉගැන්වීම සඳහා අවශ්‍යවන ගුරුවරුන් සංඛ්‍යාව, මේ වනවිට සිටින ගුරුවරුන් සංඛ්‍යාව සහ මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පාසල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා තාක්ෂණ විෂය ධාරාව ඉගැන්වීම සඳහා ගුරුවරුන් හිඟ වීමට බලපාන ලද හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1083/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැද පෙරදිග රටවල පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා තානාපති කාර්යාල යටතේ සුරක්ෂා නිවාස පවතින බවත්;

(ii) එම සුරක්ෂා නිවාසවල පවතින ඉඩ කඩ ප්‍රමාණවත් නොවන බවත්;

(iii) ඒ හේතුවෙන් ආරක්ෂාව පතා එම නිවාසවලට පැමිණෙන ගෘහ සේවිකාවන් අසරණභාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම එක් එක් සුරක්ෂා නිවසේ මේ වනවිට රැඳී සිටින ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෘහ සේවිකාවන් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1202/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද උප තැපැල් ස්ථානාධිපතිවරුන් 1996 වර්ෂයේ සිට රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බවත්;

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව හා 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම පිරිස කළමනාකරණ සහකාර සේවයේ - II ශ්‍රේණියට බඳවා ගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කළමනාකරණ සේවයේ සහකාර - II ශ්‍රේණියේ තනතුරුවල සේවය කරනු ලබන අනෙකුත් නිලධාරීන්ට හා තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන අනෙකුත් නිලධාරීන්ට ලබා දෙනු ලබන ප්‍රසූත නිවාඩු, වාර්ෂික නිවාඩු, අතිකාල දීමනා සහ කාර්යාල පහසුකම් ආදී වරප්‍රසාද ඉහත (අ) (ii) හි සඳහන් නිලධාරීන්ට ලබා නොදීමට හේතු;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 ජූලි 08 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

83/2020

ගරු හේෂා විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වලව කලාපයට අයත් ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) ඒ අතරින් ජනතාවට බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය, එම කලාපයේ එක් එක් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වලව කලාපයට අයත් ඉඩම් අතරින් විවිධ ව්‍යාපෘති සඳහා ලබා දෙන ලද අක්කර 50ට වඩා විශාලත්වයෙන් යුතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම්, අමාත්‍ය මණ්ඩල අනුමතියක් මත ලබා දුන්නේද;

(v) නොඑසේ නම්, එම ඉඩම් ලබා දෙන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

281/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ හා අමාත්‍යවරයන්ගේ කාර්ය මණ්ඩලවල සැලකිය යුතු සේවයක් සිදු කරනු ලබන පර්යේෂණ නිලධාරින්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා ප්‍රමාණවත් නොවන බවත්;

(ii) එම නිලධාරින්ට දුරකථන හා ප්‍රවාහන පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ වෙනත් වෘත්තීය ඉල්ලීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණද මේ වනතෙක් ඒ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පර්යේෂණ නිලධාරින්ගේ දීමනා හා පහසුකම් වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

315/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදුව ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(ii) මේ වනවිට එම ඛනිජ තෙල් පිරිපහදුවේ ධාරිතාවය කොපමණද;

(iii) නව ඛනිජ තෙල් පිරිපහදුවක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

744/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, එප්පාවල පොලිස් ස්ථානය ආරම්භ කරන ලද දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අබලන් තත්ත්වයක පවතින බවත්;

(ii) ආරම්භ කරන ලද දින සිට මේ වනතෙක් එම ගොඩනැඟිලි ප්‍රමාණවත් පරිදි අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

828/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විශාල පිරිසක් දකුණු කොරියාවේ සේවය කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට දකුණු කොරියාවේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2021 වර්ෂය සඳහා දකුණු කොරියාවෙන් ශ්‍රී ලංකාවට ලැබී ඇති රැකියා පංගුව කොපමණද;

(iii) එම රැකියා පංගුව සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා යොදාගන්නා ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

832/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ලද පළමු වර්ෂය කවරේද;

(ii) එම වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති මුළු සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iii) 2014.12.31 දින වනවිට ශ්‍රී ලංකාවට ලැබී තිබූ මුළු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2020 දක්වා ලැබී ඇති සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් ආයෝජන වටිනාකම එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

868/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය උතුර සහ කන්තලේ යන අධ්‍යාපන කලාප තුළ පිහිටි රජයේ පාසල්වල පවතින සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුරු හිඟය හේතුවෙන් ඉහත අධ්‍යාපන කලාප තුළ පිහිටි රජයේ පාසල්වල අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වී ඇති බව එතුමා දන්නේද;

(iii) මේ වනවිට නැගෙනහිර පළාත් සභාව ක්‍රියාත්මක නොවන අතර එම පළාත් සභාවේ පරිපාලනය සෘජුවම අදාළ ආණ්ඩුකාරවරයා යටතේ ක්‍රියාත්මක වන නිසා මෙම ගුරු හිඟය පියවීමට අමාත්‍යාංශය කඩිනමින් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1064/2020

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කල්පිටිය අර්ධද්වීපය තුළ දෙළුම් වගා කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට එහි දෙළුම් වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එහි දෙළුම් වගාවේ නිරතවන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්නෙහිද?

(ආ) (i) නිසි පරිදි තාක්ෂණික දැනුම නොලැබීම හා නිෂ්පාදන අළෙවි කර ගැනීමට අපහසු වීම වැනි ගැටලු එම ගොවීන්ට ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1109/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, පැල්ලන්දෙණිය ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ඉයෝන් ලංකා මූල්‍ය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය යටතට පත්කර තිබේද;

(ii) එම තැන්පත්කරුවන් අතරින් වැඩි ප්‍රමාණයක් විශ්‍රාමික රණවිරුවන් බව දන්නේද;

(iii) එම ආයතනයේ මුදල් තැන්පත් කර ඇති තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම තැන්පත්කරුවන්ගේ තැන්පත් මුදල්, නැවත ඔවුන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1281/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර හෝ තාවකාලික නිවාසවල පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව;

(ii) එම පදිංචිකරුවන්ගෙන් ඔප්පු හෝ බලපත්‍ර ලබාදී ඇති සංඛ්‍යාව;

(iii) ඉහත (ii) හි ඉඩම් අතරින් ඉඩම් අමාත්‍යාංශය සතු ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔප්පු හෝ බලපත්‍ර ලබා දී නොමැති ඉඩම්වල, ස්ථිර හෝ තාවකාලික නිවාස ඉදිකර ඒවායේ පදිංචි වී සිටින පවුල් ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පවුල් පදිංචි වී සිටින ඉඩම් අතරින් ඉඩම් අමාත්‍යාංශය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) බලපත්‍ර නොමැති ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම බලපත්‍ර ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජූලි 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

85/2020

ගරු හේෂා විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි කලාපවල දීර්ඝ කාලයක් පදිංචි වී සිටින ජනතාවගේ ඉඩම් සඳහා හිමිකම්පත් ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) දීර්ඝ කාලයක් ජනතාව පදිංචි වී සිටින වලව කලාපයේ සමහර ඉඩම් සඳහා හිමිකම්පත් ලබා දීමේදී එම ඉඩම් සඳහා තක්සේරු කර ඇති මුදල අසාධාරණ බව පිළිගන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iv) මහවැලි කලාපවල දීර්ඝ කාලයක් පදිංචි වී සිටින ජනතාවගේ ඉඩම් සඳහා සාධාරණ බදු මුදලක් මත හිමිකම්පත් ලබා දීම සඳහා ගතවන කාලය කොපමණද;

(v) ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතනවල ක්‍රියාකාරිත්වය සතුටුදායක මට්ටමක පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

282/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 - 2014 වකවානුව තුළ ශ්‍රී ලංකා යුද හමුදාවට කලාකරුවන් පිරිසක් විශේෂ පදනමක් මත බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, බඳවාගන්නා ලද දිනය හා තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ස්වෙච්ඡා සහ ස්ථිර යන බලසේනා අතරින් එම කලාකරුවන් බඳවාගෙන ඇති බලසේනාව කවරේද;

(ii) ඔවුන්ට හමුදා පුහුණුවක් ලබා දී තිබේ නම්, පුහුණු කාලය සහ පුහුණු කඳවුරේ නම කවරේද;

(iii) පුහුණුවෙන් පසු එම එක් එක් කලාකරුවාට පවරන ලද රාජකාරි, අනුයුක්ත කරන ලද රෙජිමේන්තුව, ගෙවන ලද වැටුප්, දීමනා හා වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත බඳවා ගැනීම නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට සම්බන්ධ පාර්ශවයන්ට එරෙහිව ගන්නා ලද හා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

466/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ උත්පාදනය වූ නව රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2014 වර්ෂයට සාපේක්ෂව ඉහත කාලය තුළදී සිදු වූ විරැකියා අනුපාතයේ වෙනස කවරේද;

(iv) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ දිගුකාලීන නිෂ්පාදන ධාරිතාවයේ සිදු වූ වෙනස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

541/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 සිට මේ දක්වා ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීමට ඇති මුදල කොපමණද;

(ii) එම මුදල අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

869/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි කුරින්ජාක්කේනි පාලම 2014 වර්ෂයේදී ඇති වූ ගංවතුර හේතුවෙන් විනාශ වූ අතර එදින සිට එම ප්‍රදේශවල ජීවත්වන ජනතාව තාවකාලික පාලමක් භාවිතා කරන බවත්;

(ii) එම පාලම ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ටෙන්ඩර් කැඳවනු ලැබූ අතර පසුව එවකට අග්‍රාමාත්‍යවරයා විසින් එම පාලම ඉදිකිරීම සඳහා මුල්ගල තැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීම සඳහා වූ ටෙන්ඩරය ලබා ගන්නා ලද පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

(iii) පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iv) එහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

934/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, මුල්ලියාවලයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් 22ක් ආවරණය වන තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන බවත්;

(ii) ඒ සඳහා රු. 20,000/- ක මාසික කුලියක් ගෙවන බවත්;

(iii) එම තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර දෙන ලෙස ජනතාව සහ පොදු සංවිධාන විසින් ඉල්ලීම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) මුල්ලියාවලයි ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් ගුණාත්මක තැපැල් සේවයක් ලබා දීම සඳහා ඉහත තැපැල් කාර්යාලය වෙනුවෙන් ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ල ඉදිකරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

948/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය සභා බලප්‍රදේශයක් වන නෙඩුන්තීවු දූපතේ ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වන්නේ මුහුදු මාර්ගය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දූපතේ ක්‍රියාත්මක වන "නෙඩුන්තාරකෙ" නැමැති මගී යාත්‍රාවේ සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ තනතුර, පත්වීම් දිනය සහ සේවා පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් නිලධාරීන්ට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දී ඇත්තේ කවුරුන්ද;

(ii) විලියම් යේසුදාසන්, ඇන්ටනී රාජ්, සින්දාකුලම් මෙල්කියාස් මිලන්, ඇල්ෆ්‍රඩ් මරියදයාලන්, ඇන්ටනි අමලදාසන්, ඇන්ඩෲස් රකීම්ලයෝන් යන නිලධාරීන්ට, ඔවුන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් මත ස්ථිර පත්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම ස්ථිර පත්වීම් ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

8\.

1282/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික බඩඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) ඉහළ බඩඉරිඟු ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන දිස්ත්‍රික්කවල නම් කවරේද;

(iii) එම එක් එක් දිස්ත්‍රික්කයේ බඩඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කරනු ලබන බඩඉරිඟු ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) එම බඩඉරිඟු ආනයනය කරනු ලබන රටවල්වල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාවට බඩඉරිඟු ආනයනය කරනු ලබන සමාගම්වල නම් කවරේද;

(iv) බඩඉරිඟු ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ වාර්ෂික බඩඉරිඟු නිෂ්පාදනය, දේශීය පාරිභෝජනය සඳහා ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) දේශීය බඩඉරිඟු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

9\.

1336/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත සමෘද්ධි සංවර්ධන නිලධාරීන්;

(ii) එම දිස්ත්‍රික්කයේ මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්;

(iii) ඒ අනුව පවතින පුරප්පාඩු;

(iv) එම දිස්ත්‍රික්කයේ මුළු සමෘද්ධි ප්‍රතිලාභීන්;

(v) එම දිස්ත්‍රික්කයේ පසුගිය රජය විසින් සමෘද්ධි සහනාධාර ලබා දෙන ලද නව සමෘද්ධි ප්‍රතිලාභීන්;

සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන නිර්ණායක කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1364/2020

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බදුල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ IV ශ්‍රේණියේ නිලධාරි තනතුරක සේවය කළ ජේ.එම් කැලුම් ජයසුන්දර මහතා 2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී මොණරාගල දිස්ත්‍රික්කය සඳහා අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වූ බවත්;

(ii) මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා නිවාඩු ඉල්ලා ඔහු විසින් බදුල්ල ප්‍රාදේශීය කළමනාකරු වෙත 2020.03.17 ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්;

(iii) මේ අතරතුර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වැල්ලවාය ඩිපෝව මඟින් මාසික වැටුප් දෙකක් ඔහුගේ පෞද්ගලික ගිණුමට බැර කර ඇති බවත්;

(iv) එම වැටුප් නැවත ගෙවීම සඳහා ඔහු බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණියද ඒ වනවිට ඔහුගේ සේවය අත්හිටුවා ඇති බවත්;

(v) එම වැටුප් නැවත ගෙවීම ප්‍රමාද වීමට හේතුව කොවිඩ්-19 වසංගත තත්ත්වය බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙසේ සේවය අත්හිටුවීමෙන් ජයසුන්දර මහතාට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) ඔහු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 ජූලි 20 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

46/2020

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා විදුලිය ලබා දීමට වැඩසටහනක් දියත් කර තිබේද;

(ii) පසුගිය යහපාලන රජය බලයට පත්වූ දින සිට මේ දක්වා එම වැඩසටහන යටතේ විදුලිය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පවුල් තෝරා ගැනීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

176/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලු පාරේ කොළඹ සිට මොරටුව දක්වා පවතින අධික මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් සිදු කරනු ලබන මුහුදුබඩ මාර්ගයේ (Marine Drive) ඉදිකිරීම් කටයුතු, කොල්ලුපිටියේ සිට දෙහිවල - වාසල පාර දක්වා පමණක් සිදු කර ඇති බවත්;

(ii) එම ව්‍යාපාතියේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමී බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමිවන්නන් සඳහා ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(ii) වන්දි මුදල් ලබා දීමට තවදුරටත් ඉතිරිව තිබේ නම්, එම මුදල් ලබා දීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

195/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නොරොච්චෝල ප්‍රදේශයේ සුළං විදුලි බලාගාරයක් පිහිටා තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බලාගාරය තුළින් ජනනය කරනු ලබන විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුලි බලාගාරයේ ට්‍රාන්ස්ෆෝමරය අක්‍රිය වූ දිනය හා එය නැවත ප්‍රතිසංස්කරණය කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බලාගාරය තවදුරටත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

239/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සුදු ලූනු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම සුදු ලූනු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම සුදු ලූනු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සුදු ලූනු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

352/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ මූලික අරමුණින් හෝටල් සහ ආපනශාලා වෙත මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබා දෙන බවත්;

(ii) සංචාරකයන් නොගැවසෙන ප්‍රදේශවල පිහිටා ඇති ඇතැම් හෝටල් සහ ආපනශාලා වෙතද මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2018 සහ 2019 වර්ෂවලදී හෝටල් සහ ආපනශාලා වෙත මද්‍යසාර විකිණීම සඳහා ලබා දෙන ලද බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බලපත්‍ර ලබා දී ඇති හෝටල් සහ ආපනශාලා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ මුවාවෙන් ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන මද්‍යසාර අලෙවි ස්ථාන වැඩිවීමෙන් මද්‍යසාර භාවිතය ඉහළ යන බැවින් මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය වෙනස් කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

535/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් එක් එක් කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී අස්වැන්න;

(ii) එම වී අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් එක් එක් කන්නයේ දී මිලදී ගත් වී ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ වී අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක්, වී අලෙවි මණ්ඩලය මඟින් ඉදිරියේදී මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

605/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව 2020/2021 මහ කන්නයේ වගා කටයුතු සඳහා රසායනික පොහොර නොමිලේ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, වගා කරනු ලබන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iii) වී වගා කරන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, වී වගා කරනු ලබන එක් අක්කරයක් සඳහා එක් එක් පොහොර වර්ගවලින් ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අතිරේක බෝග වගා කිරීම සඳහා අක්කරයකට ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

659/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල නගරය, ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම නගරයක් බවත්;

(ii) එම නගරය ක්‍රමානුකූලව සංවර්ධනය කළ යුතු බවත්:

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල නගරය ක්‍රමවත්ව සංවර්ධනය කිරීම සඳහා මේ වනවිට සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, සැලසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අරමුදල් සපයා ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම අරමුදල් සපයා ගනු ලබන ප්‍රභවයන් කවරේද;

(iv) කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

723/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක තුළ මේ වනතෙක් ගිනි නිවීම් ඒකකයක් නොමැති වීමෙන් අනපේක්ෂිත ගිනි ගැනීම් සිදුවන අවස්ථාවන්හිදී ජීවිත සහ දේපළ හානි සිදු වන බවත්;

(ii) මන්නාරම නගර සභාව සහ මුලතිව් කරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය සභාව සඳහා ගිනි නිවීම් ඒකක ලබා දෙන බවට පොරොන්දු වුවද, මේ වනතෙක් ගිනි නිවීම් ඒකක ලබා දී නොමැති බවත්;

(iii) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල ගිනි ගැනීම් සිදු වන අවස්ථාවන්වලදී වවුනියාවේ සිට ගිනි නිවීමේ රථයක් පැමිණිය යුතු අතර ඒ සඳහා පැය එක හමාරක පමණ කාලයක් ගත වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා ගිනි නිවීම් ඒකක ලබා දෙනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

859/2020

ගරු ජගත් කුමාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීමේ වැඩපිළිවෙළ යටතේ බස්රථ, දුම්රිය සහ ත්‍රිරෝද රථ යන ප්‍රවාහන මාධ්‍යයන් සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍යවන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ හා පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද ;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු හා කොන්දොස්තර තනතුරුවල පුරප්පාඩු පවතින බව පිළිගන්නේද?

(ii) එසේ නම්, එම තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තලංගම ඩිපෝව මඟින් ප්‍රවාහන කටයුතු සඳහා යොදවා තිබෙන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රමාණවත් රියදුරන් හා කොන්දොස්තරවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයක් සිටින්නේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නොඑසේ නම්, ප්‍රවාහන කටයුතු සිදුකරන ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 ජූලි 22 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

67/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අපද්‍රව්‍ය කළමනාකරණය යන විෂයය, පළාත් සභා යටතට ගැනෙන විෂයයක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, පළාත් සභා ක්‍රමය ආරම්භයේ සිට මේ වනතෙක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම ආයතන ස්ථාපිත කර ඇති පළාත් සභාවල නම් කවරේද;

(ii) එවැනි විශේෂිත ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභාවල නම් කවරේද;

(iii) එවැනි ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභා සඳහා සුවිශේෂී ආයතනයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

2.

199/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පවතින කැබිනට් අමාත්‍යාංශ සංඛ්‍යාව සහ රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන කැබිනට් අමාත්‍යංශ හා රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම් ;

(iii) ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ රජයේ ගොඩනැගිලි වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

242/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වාහන අමතර කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වාහන අමතර කොටස් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එකී වාහන අමතර කොටස් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වාහන අමතර කොටස් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

355/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පානීය ජලය සපයන වැව්වල ජලයේ ගුණාත්මකභාවය පිරිහී ඇති බවත්;

(ii) E-coli ඇතුළු විෂබීජ අඩංගු වීම හේතුවෙන් එම ජලය ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පානීය ජලය ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන වැව්වල නම් කවරේද;

(ii) එම වැව්වල ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

519/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාලච්චේන ධීවර වරාය තුළ සාමාන්‍ය ට්‍රෝලර් යාත්‍රා හැසිරවිය හැකි වුවත්, විශාල ප්‍රමාණයේ ට්‍රෝලර් යාත්‍රා හැසිරවීම සඳහා එහි පිවිසුම සහ ගැඹුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දේශීය ධීවරයින් ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්;

(ii) එම ධීවර වරාය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර වරාය පුළුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

543/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවාගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් තනතුරු නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

671/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ඉදිකිරීම් ආරම්භ කරන ලද බිංගිරිය, කිණියම වාරි ව්‍යාපෘතියේ යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා ගත වන කාලය කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතිය මඟින් පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

757/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) වන අලින්ගේ සංචරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) වන අලින් වැඩි වශයෙන් සංචරණය කරන ජාතික වනෝද්‍යාන හා රක්ෂිත වනාන්තර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අලි කොරිඩෝ තිබේ නම්, ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) අලි කොරිඩෝ හරස්වන ආකාරයට ගම්මාන හෝ ජනතාව පදිංචි ස්ථාන තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2020 සැප්තැම්බර් දක්වා දිස්ත්‍රික්කයේ අලි - මිනිස් ගැටුමෙන් —

(i) මියගිය පුද්ගලයන් හා වන අලින් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව;

(ii) හානි වී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iii) මියගිය හා දේපළ අහිමිවූවන්ට ගෙවා ඇති වන්දි මුදල එක් එක් පුද්ගලයා අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට ගත් නව ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

803/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිළි / වට්ටක්කච්චි මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇති බවත්;

(ii) එම පාසල සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන, මුදා නොහැරීම හේතුවෙන් ශ්‍රවණාගාරය ඉදිකිරීම මේ වනවිට නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය කවරේද;

(ii) එම ප්‍රතිපාදන, මුදා නොහැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

(iii) එහි ඉදිකිරීම් සම්පූර්ණ කර සිසුන්ගේ භාවිතය සඳහා ලබා දීමට ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

871/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝව සතු මේ වනවිට ධාවනයේ යෙදවීමට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව කොපමණද ;

(iv) මේ වනවිට එම එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ඩිපෝවල සේවය කරනු ලබන මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා හා එම ඩිපෝවල පවතින බස්රථ ඇණි වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 අගෝස්තු 03 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

71/2020

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දේශීය කිරිපිටි කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලාවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ වනතෙක් එම කර්මාන්තශාලාවල නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්තමානයේදී දේශීය කිරිපිටි කර්මාන්තශාලා මුහුණ දී ඇති ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

243/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ රෙදිපිළි සහ ඇඳුම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම රෙදිපිළි සහ ඇඳුම් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම රෙදිපිළි සහ ඇඳුම් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට රෙදි පිළි සහ ඇඳුම් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

256/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා මේ වනවිට අනුමත බන්ධනාගාර නිලධාරින් සංඛ්‍යාව;

(ii) එම දෙපාර්තමේන්තුවේ මේ වනවිට සේවයේ නියුතු බන්ධනාගාර නිලධාරින් සංඛ්‍යාව;

(iii) දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින පුරප්පාඩු පිරවීම;

(ii) බන්ධනාගාර තුළ සිදුවන අක්‍රමිකතා වැළැක්වීම;

සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

271/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.23 සිට 2018.10.31 දක්වා කාලය තුළ විදේශ පුහුණුවීම් සඳහා සහභාගි වූ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුහුණුවීම් සඳහා ආයතනය විසින් දරන ලද මුදල එක් එක් සේවකයා අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශයන්හි පුහුණුව ලැබූ සේවකයන්ගේ දැනුම, ශ්‍රී ලංකාවට උචිත පරිදි යොදාගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් ආයතනය තුළ ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

618/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය විශ්වවිද්‍යාලවල බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් ලියාපදිංචි කිරීම නැවැත්වීම සඳහා මේ වනවිට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එවැනි තීරණයක් ගැනීමට බලපාන ලද හේතු කවරේද;

(iii) ඒ හේතුවෙන් මේ වනවිට බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් දැඩි දුෂ්කරතාවයකට පත්වන බව දන්නේද;

(iv) එසේ නම්, බාහිර උපාධි පාඨමාලා නැවත කඩිනමින් ආරම්භ කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

833/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එම නිෂ්පාදනාගාර පවත්වා ගෙන යනු ලබන ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් මත්පැන් නිෂ්පාදනාගාර අතරින් 2015 වර්ෂයෙන් පසුව වසා දමන ලද මත්පැන් නිෂ්පාදනාගාර තිබේද;

(ii) එසේ නම්, එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එසේ වසා දමන ලද නිෂ්පාදනාගාරවල මත්පැන් නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

872/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ පාසල්වල මේ වනවිට සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

907/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර, තලාව නගරයේ බස් නැවතුම්පළෙහි ගොඩනැගිලි ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) වැසි දිනවලදී එම බස් නැවතුම්පළ මගී ජනතාවට භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම බස් නැවතුම්පළ අලුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

930/2020

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන "Contact Sri Lanka" වෙබ් අඩවියේ ලියාපදිංචි වී ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට ඉල්ලුම් කර ඇති විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්;

(ii) ඉහත පුරවැසියන් අතරින් මේ වනවිට ශ්‍රී ලංකාවට ගෙන්වා ගෙන ඇති පුරවැසියන්;

සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට ඉල්ලුම් කර ඇති විදේශගත ශ්‍රී ලාංකිකයන් ගෙන්වා ගැනීම සඳහා සැලසුම්කර ඇති වැඩපිළිවෙල කවරේද;

(ii) මාසිකව ගෙන්වා ගැනීමට සැලසුම් කර ඇති සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(iii) සියලුම දෙනා නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට නියමිත කාල වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ශ්‍රී ලාංකිකයන් අතර සිටින රෝගීන්, වැඩිහිටියන්, ගැබිණි මව්වරුන්, දරුවන් සහ රැකියා අහිමිවූවන් ආදී විශේෂ කණ්ඩායම්වල සුභසාධනය සම්බන්ධයෙන් එම එක් එක් රටවල පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

973/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් වෛද්‍ය, ඉංජිනේරු, සත්කාරක සේවා සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය පාඨමාලා පවත්වනු ලබන විශ්වවිද්‍යාලවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පීඨ සහ මණ්ඩපවල නම් කවරේද;

(iii) වර්ෂ 2015 සිට 2019 දක්වා ඉහත විශ්වවිද්‍යාලයේ ස්ථාපනය කරන ලද මණ්ඩපවල නම් කවරේද;

(iv) එම මණ්ඩප සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සත්කාරක සේවා සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය මණ්ඩපයක් ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා සංචාරක කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන ආරුගම්බේ පිහිටි පොතුවිල් ප්‍රදේශය තෝරා ගන්නේද;

(iii) එසේ නම්, පොතුවිල් ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් උක්ත මණ්ඩපය ආරම්භ කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අගෝස්තු 04 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

29/2020

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයස අවුරුදු 70 සම්පූර්ණ කරන ලද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත ගෙවනු ලබන මාසික දීමනාව රු.2000/- ක් බවත්;

(ii) එසේ ගෙවනු ලබන දීමනාවෙන් රු.100/-ක් 2016 ජනවාරි මාසයේ සිට නොගෙවා රඳවාගන්නා බවත්;

(iii) මෙලෙස මුදල් රඳවාගැනීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විරෝධය දක්වන බවත්;

(iv) මෙලෙස රඳවාගන්නා මුදල, සමාජ ආරක්ෂණ අරමුදල නමින් ගිණුමක තැන්පත් කරන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) මේ වන තෙක් එසේ රඳවාගෙන ඇති මුළු මුදල කොපමණද;

(ii) එසේ රඳවාගෙන ඇති මුදල් යොදා ගනිමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ යහපත පිණිස ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එසේ රු.100/- බැගින් රඳවාගැනීම අත්හිටුවීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

136/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාව පුරා සිදු වූ විදුලිය බිඳ වැටීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුලිය බිඳ වැටීම් සිදු වූ දිනයන් කවරේද;

(iii) එම විදුලිය බිඳ වැටීම්වලින් පසුව පත් කරන ලද කමිටු සංඛ්‍යාව කොපමණද;

(iv) එම කමිටු මඟින් ලබාදෙන ලද නිර්දේශ කවරේද;

(v) ශ්‍රී ලංකාවට පැය 24 පුරාම අඛණ්ඩව විදුලිය ලබා දීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

177/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රෝහලක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහල් පරිශ්‍රයේ ඉදිකරමින් පවතින මහල් 13කින් සමන්විත වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමීව සිදු කරනු ලබන බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) ඊට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

189/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සිවිල් ආරක්ෂක බලකාය විසින් කිළිනොච්චි, මුලතිව්, වව්නියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික ගොවිපොළ රාශියක් පවත්වාගෙන යනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් දිස්ත්‍රික්කයන්හි එලෙස පවත්වාගෙන යනු ලබන ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම එක් එක් ගොවිපොළහි සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව, විශාලත්වය අක්කරවලින්, පිහිටා ඇති ස්ථානය, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්ෂක හමුදා විසින් පවත්වාගෙන යන ගොවිපොළවල් අතරින් උතුරු පළාත් සභාව වෙත භාරදිය යුතු ගොවිපොළ මේ වනතෙක් එම පළාත් සභාව වෙත භාරනොදීමට හේතු කවරේද;

(ii) එම ගොවිපොළවල් උතුරු පළාත් සභාව වෙත භාර දෙනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

5.

324/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික මීවන විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති මීවන විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික මීවන විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික මීවන පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික මීවන ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

469/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල;

(ii) ඉහත එක් එක් වර්ෂයට අදාළව පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල, එම වර්ෂයේ සමස්ත අයවැයෙහි ප්‍රතිශතයක් ලෙස;

(iii) ඉහත සඳහන් එක් එක් වර්ෂයේ ලියාපදංචි කරන ලද නවෝත්පාදන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමේදී අනුගමනය කල යුතු ක්‍රමවේදය කවරේද;

(ii) නවෝත්පාදන සිදුකරනු ලබන පර්යේෂකයන් මුහුණ දෙනු ලබන මූල්‍ය දුෂ්කරතා අවම කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

613/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලා වැව සිට තිසා වැව දක්වා ජලය ගෙන යන පරණ යෝධ ඇළ බැම්ම කි.මී.12ක් පමණ දුරකින් යුක්ත වන අතර ගොවීන් විශාල පිරිසක් එම ඇළ බැම්ම විවිධ අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගන්නා බවත්;

(ii) මේ වනවිට අබලන් වී ඇති එම වැව් බැම්ම පිළිසකර කිරීමට බලධාරීන්ගේ අවධානය යොමු වී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද;

(ආ) (i) මෙම මහ කන්නයට පෙර එම ඇළ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1337/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වන අලි ගහණය 7500ක් පමණ බව ඇස්තමේන්තුකර ඇති බවත්;

(ii) වන අලින් විසින් වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 10ක පමණ වගා හානියක් සිදුකරනු ලබන බවත්;

(iii) අලි - මිනිස් ගැටුම හේතුවෙන් වර්ෂ 2016 සිට 2019 දක්වා පිළිවෙළින් වන අලින් 206, 279, 319 හා 293ක් සහ මිනිසුන් 70, 87, 98 හා 93ක් මියගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වන අලින් ගම්වැදීම වැළැක්වීම සඳහා ඉදිකර ඇති අලිවැට ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) නව අලිවැට ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම අලිවැට සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිකර ඇති අලිවැට නඩත්තු කිරීමට යොදවා ඇති සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගම්වදින වන අලින් පලවා හැරීමට එක් පුද්ගලයකුට මාසිකව ලබා දෙනු ලබන අලිවෙඩි සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලිවෙඩි බෙදාහැරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අගෝස්තු 05 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

72/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් නියෝජිතයාගේ නම හා අදාළ පළාත් පාලන ආයතනයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් වැඩමුළුව පැවති රට, නගරය හා කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වැඩමුළුවට සහභාගි වීම සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කළ පළාත් පාලන ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

244/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වෛද්‍ය තාක්ෂණික උපකරණ ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වෛද්‍ය තාක්ෂණික උපකරණ ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම වෛද්‍ය තාක්ෂණික උපකරණ ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වෛද්‍ය තාක්ෂණික උපකරණ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

260/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වත්මන් සාමාජික/සාමාජිකාවන්ගේ නම් හා ඔවුන්ගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය කාලයේදී සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන කටයුතුවල බිඳවැටීමක් සිදුව තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

323/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික ජලවාංග හා එවැනි ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති ජලවාංග හා එවැනි ශාක විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික ජලවාංග හා එවැනි ශාක විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික ජලවාංග හා එවැනි ශාක විශේෂ පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික ජලවාංග හා එවැනි ශාක විශේෂ ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

619/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කලා විෂය ධාරාවෙන් බාහිර උපාධි පාඨමාලා සඳහා නිර්දේශිත විෂයයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විෂයන්වල නම් කවරේද;

(iii) එම විෂය ධාරාවන් යම් සමාලෝචනයකට ලක්කර තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්තමාන රැකියා වෙළඳපොළට සහ ගෝලීය ප්‍රවණතාවලට අනුගත විය හැකි බාහිර උපාධිධාරියෙකු බිහි කිරීමට ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

818/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව දේශීය කර්මාන්ත දිරිගැන්වීම රජයේ අරමුණ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද නව කර්මාන්ත කවරේද;

(ii) 2021 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති නව කර්මාන්ත සහ එම කර්මාන්ත ආරම්භ කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) එම කර්මාන්ත ආරම්භ කිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයන් ඉදිරිපත් වී තිබේද;

(iv) එසේ නම්, එම ආයෝජකයන් දිරිගැන්වීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

834/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය විදුලිබලය, සුළං විදුලිබලය සහ කුඩා ජල විදුලි බලාගාරවලින් විදුලිය මිලදී ගැනීමේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය, එක් එක් මිලදී ගැනීම් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ස්ථාවර මිලට විදුලිය මිලදී ගැනීම් සිදු කරන ලද වකවානුවේදී, ඉහත සඳහන් විදුලිය මිලදී ගැනීම්වලදී ඒකකයක් සඳහා අවසන්වරට ගෙවන ලද මිල, එක් එක් මිලදී ගැනීම් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් මිල, තීරණය කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

851/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රධාන වැව් බොහොමයක සැල්වීනියා නැමැති පාසි වර්ගය වැවී ඇති බවත්;

(ii) ඉහත වැව් අතරින් ගිරිතලේ ගොවි ජනපද ව්‍යාපාරයට අයත් වන තඹල වැව හා කඩවල වැව යන වැව්වල මෙම පාසි වර්ගය විශාල වශයෙන් වැවී ඇති බවත්;

(iii) එම වැව්වල පාසි වැවී තිබීම හේතුවෙන් ඒවාගේ රඳවාගත හැකි ජල ධාරිතාවය අවම වී ඇති අතර එම වැව්වලින් කෘෂිකර්මාන්තයට සපයනු ලබන ජල ප්‍රමාණයද අවම වී ඇති බවත්;

(iv) කඩවල වැව වැසි කාලයේදී වාන් දමන අතර එම වාන් ජලය සමඟ පාසි බීජ ගලා විත් එම වැවට පහළින් පිහිටා ඇති පරාක්‍රම සමුද්‍රයට පාසි බෝවීමේ අවදානමක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, තඹල වැව හා කඩවල වැව යන වැව්වල මේ වනවිට වැවී ඇති පාසි ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

931/2020

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට නැවත රැගෙන ඒම සඳහා ගුවන්යානා පහසුකම් සැපයීමට අවසර ලබා දී ඇති සමාගම්වල නම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගත් ක්‍රමවේදය කවරේද;

(iii) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට නැවත රැගෙන ඒමේදී ඉහත සමාගම් විසින් අසාධාරණ ලෙස ගාස්තු අයකරන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරෝධායනය කරවීම සඳහා අනුමැතිය ලබා දී ඇති පෞද්ගලික සමාගම්වල නම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගත් ක්‍රමවේදය කවරේද;

(iii) ශ්‍රී ලංකාවට නැවත පැමිණි විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරෝධායනය කරවීමේදී ඉහත සමාගම් විසින් අසාධාරණ ලෙස ගාස්තු අයකරන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

974/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොතුවිල් ප්‍රාදේශීය සභාව විසින් සිය බලප්‍රදේශයේ පිහිටි නිවාස සඳහා අක්‍රමවත් ලෙස ජල සැපයුම් ලබා දෙනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති, ජලය සහ මලාපවහන පහසුකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ජලය සහ මලාපවහන පහසුකම් ලබා දීමට වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අගෝස්තු 06 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

81/2020

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෘෂිරසායන ද්‍රව්‍ය හා පොහොර භාවිතා කිරීම සහ විවිධ මානව ක්‍රියාකාරකම් මඟින් සිදු වන පරිසර විනාශය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර අපවිත්‍ර වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනතාවගේ පරිභෝජනය සඳහා යෝග්‍ය නොවන ජලය සහිත ශ්‍රී ලංකාවේ ගංගා, වැව් හා අනෙකුත් ජල මූලාශ්‍ර සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ගංගා, වැව් හා අනෙකුත් ජල මූලාශ්‍රවල ජලය දූෂණය වීමට ප්‍රධාන හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ස්ථානවල ජලය පරිභෝජනය සඳහා යෝග්‍ය වන පරිදි පිරිසිදු කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) ඉදිරියේදී ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

171/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලෝලෙවල් මාර්ගයේ අඹතලේ සිට ඔරුගොඩවත්ත දක්වා කොටසේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම මාර්ගය සංවර්ධනය කිරීම ප්‍රමාද වීමට හේතුවන කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ මේ වනවිට සංවර්ධන කටයුතු නිම කර ඇති ප්‍රමාණය සහ තවදුරටත් නිම කිරීමට ඉතිරිව ඇති ප්‍රමාණය;

(ii) මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමිවූවන් අතරින් මේ වනවිට වන්දි ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ වන්දි මුදල;

(iii) තවදුරටත් වන්දි ලබා දීමට ඉතිරිව ඇත්නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, වන්දි මුදල සහ එම වන්දි ලබා දීමට අපේක්ෂිත දිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

178/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි තැපැල් සහ උප තැපැල් කාර්යාල වර්ගකිරීම අනුව නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ පිහිටි තැපැල් සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ස්ථිර ඉඩම් සහ ගොඩනැගිලි සහිත තැපැල් සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරදිපුරම්, පුන්නෛනීරාවි, පල්ලික්කුඩා ප්‍රදේශයන්හි උප තැපැල් කාර්යාල ඉදිකිරීමට අවශ්‍ය බව දන්නේද;

(ii) එසේනම්, 2016.09.05 දින එවකට අමාත්‍යවරයාට මවිසින් යොමු කළ ලිපිය අනුව, තැපැල්පතිවරයා වෙත යොමු කරන ලද අංක PPS&MR/HR/09-182 හා 2016.09.09 දිනැති ලිපියට පියවරක් නොගත්තේ මන්ද;

(iii) කල්මඩුනගර්, තිරුනගර්, කෝනාවි, කරඩිබෝක්කු, තිරුවෛයාරු, අම්බාල්කුලම්, මුරසුමෝට්ටෛ, දරුම්පුරම්, කණ්ඩාවලෛ, පුලියම්පොක්කනෛ, කුංජුපරන්දන්, සිවනගර්, මුහමාලෛ, ඉයක්කච්චි, කිළාලි, එලුදුමට්ටුවාල්, සෝරන්පට්ටු, තට්ටුවන්කොට්ටි, සුණ්ඩික්කුළම්, සෙට්ටියකුරුච්චි, ඉරනෛතිවු, ගෞදාරිමුනෛ, පල්ලවරායන්කට්ටු, නල්ලූර්, කිරාංජි හා වේරවිල් යන උප තැපැල් කාර්යාලවලට ස්ථිර ගොඩනැගිලි පහසුකම් ලබාදෙන දිනය කවරේද;

(iv) දිස්ත්‍රික්කයේ, ප්‍රධාන තැපැල් කාර්යාල හතර වන කිළිනොච්චි, පරන්තන්, පච්චිලෛපල්ලි හා පූනගරි නවීන පරිගණක පහසුකම් සහිතව ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

4.

284/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මානව පරිභෝජනයට සුදුසු පලා වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම පලා වර්ගවල ඇති පෝෂණ තත්ත්වය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iv) එම පලා වර්ග අතර ඇති ඒක දේශික පලා වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීය පලා වර්ගවල පෝෂණ හා ඖෂධීය ගුණය ඉහළ බවත්;

(ii) වන විනාශය හා රසායනික පොහොර භාවිතය හේතුවෙන් එම පලා වර්ග දුර්ලභ වී ඇති බවත්;

(iii) ඒ අතරින් ඇතැම් පලා වර්ග මේ වනවිට වඳ වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දේශීය පලා වර්ග ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

431/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගය මේ වනවිට ඉදිකරමින් පවතින බවත්;

(ii) එම අධිවේගී මාර්ගයේ කොටසක් අලව්ව හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා ඉදිකරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඉහත ප්‍රදේශවල ජීවත්වන පවුල්වලින් අත් කරගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම අත් කර ගැනීම් වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කර තිබේද;

(iii) නොඑසේ නම්, සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

443/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැඩි මූල්‍ය අර්බුදයකට ලක් වී ඇති බව දන්නේද;

(ii) එම මුල්‍ය අර්බුදයෙන් එම ආයතනය මුදා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

523/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මහ කන්නයේ කුඹුරු වගා කරන ගොවීන් සංඛ්‍යාව හා ඔවුන් වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම කුඹුරුවලින් සුළු වාරිමාර්ග, මහ වාරිමාර්ග සහ මහවැලිය යටතේ වගා කරන කුඹුරු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම කුඹුරුවලට පොහොර සහනාධාරය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ වැව, මින්නේරිය වැව හා කවුඩුල්ල වැව යන මහ වැව්වල ජලයෙන් වගා කරන බිම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ජලයෙන් වගාකටයුතු සිදුකරන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iii) සෑම වර්ෂයකම මහ කන්නයේ අහස් ජලයෙන් වගා කරන හේන්, ගෙවතු ආදිය තිබේද;

(iv) එසේ නම්, ඒවායේ අක්කර ප්‍රමාණය ගොවිජන බලප්‍රදේශ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් පොළොන්නරු දිස්ත්‍රික්කයේ දායකත්වය, මෙට්‍රික් ටොන් ප්‍රමාණය හා ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

553/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජාතික මාර්ග, පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ගවල දුර ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මාර්ග අතරින්—

(i) කාපට් අතුරා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(ii) තාර දමා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(iii) තාර දමා හෝ කාපට් අතුරා නොමැති මාර්ගවල දුර ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් ග්‍රාමීය මාර්ග ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

601/2020

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මධ්‍යම අධිවේගී මාර්ග —

(i) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) ව්‍යාපෘතියට මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට වැය කළ යුතු ඉතිරි මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබූ දිනය කවරේද;

(v) ව්‍යාපෘතියට අදාළව පසුගිය රජය සමයේ සිදුවූ අක්‍රමිකතා/ප්‍රමාදයන් හේතුවෙන් එය අවසන් කළ හැකි යැයි අනුමාන කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු —

(i) භාර දී ඇති සමාගම් කවරේද;

(ii) ප්‍රමාද කොට ඇති සමාගම්වලට එහි ඉදිකිරීම් කටයුතු නැවත පවරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතියේ මහනුවර නගරයට ආසන්න අවසන් පිවිසුම ඇති ප්‍රදේශය කවරේද;

(ii) මහනුවර සිට ගලගෙදර දක්වා වූ මාර්ගයේ පවතින දැඩි වාහන තදබදය හේතුවෙන් ඒ ඔස්සේ අධිවේගී මාර්ගයට පිවිසීමට විනාඩි 30 - 45 අතර කාලයක් ගත වන බැවින් මහනුවර ප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් අධිවේගී මාර්ගයට ප්‍රවිෂ්ට වීමට පිවිසුම් මාර්ග සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම අධිවේගී පිවිසුම් ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

612/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව පොලිස් ස්ථානය මඟින් ග්‍රාම නිලධාරි කොට්ඨාස 49 ක් පමණ ආවරණය කරන අතර එහි පොලිස් නිලධාරීන් 200 ක් පමණ සේවය කරන බවත්;

(ii) එම පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වසර 50 ක් පමණ පැරණි බවත්;

(iii) එම පොලිස් ස්ථානයේ ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බැරැක්ක භාවිතා කරනු ලබන නිලධාරීන් වැසි දිනවලදී ඉතා අසීරුතාවයකට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කැකිරාව පොලිස් ස්ථානයේ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අගෝස්තු 17 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

35/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා යොදවන ලද සමස්ත ප්‍රාග්ධනය, සංචිත ප්‍රමාණය, කොටස් මත ලද ආදායම, වත්කම් මත ලද ආදායම, සමස්ත සේවක සංඛ්‍යාව, එක් සේවකයෙකු වෙනුවෙන් වැය කළ මුදල, පුනරාවර්තන නොවන වියදම, බදු ලෙස රජයට ගෙවන ලද මුදල, සහ ලාභය හෝ අලාභය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

2.

139/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ රැකියා විරහිත උපාධිධාරින්ට රැකියා ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රැකියා විරහිත උපාධිධාරින්ට රැකියා ලබාදීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග;

(ii) එම වැඩසටහන යටතේ මේ වනතෙක් රැකියා ලබා දී ඇති උපාධිධාරින්ගේ නම්;

(iii) ඔවුන්ගේ සේවා ස්ථාන;

(iv) ඔවුන්ගේ රාජකාරිවල ස්වභාවය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

170/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාලබේ සිට කොළඹ-කොටුව දක්වා සැහැල්ලු විදුලි දුම්රිය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබූ බවත්;

(ii) එම ව්‍යාපෘතිය සඳහා පාංශු පරීක්ෂාව හා ඉඩම් අත්පත්කර ගැනීමට අදාළ මැනුම් කටයුතු සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේනම්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

4.

325/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික උරග සහ සර්ප විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති උරග සහ සර්ප විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික උරග සහ සර්ප විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික උරග සහ සර්ප විශේෂ පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික උරග සහ සර්ප විශේෂ ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

416/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2018 සහ 2019 යන වර්ෂවල —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(iii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(ii) 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2018-2019 යන වර්ෂවල සහ 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල ගණන් අතර වෙනසක් තිබේද;

(ii) එසේ නම්, එම වෙනස කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

580/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම එක් ප්‍රාදේශීය සභාවක් බැගින් පිහිටුවා ඇති බවත්;

(ii) මේ වනතෙක් ප්‍රාදේශීය සභාවක් පිහිටුවා නොමැති මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කණ්ඩාවලෙයි සහ යාපනය දිස්ත්‍රික්කයේ වෙත්තිලකර්ණි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ප්‍රාදේශීය සභා පිහිටුවන ලෙසට අඛණ්ඩව ඉල්ලීම් කළද මේ වනතෙක් එම ඉල්ලීම් ඉටු කර නොමැති බවත්;

(iii) මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සින්නවලයන්කට්ටු, කාක්කයන්කුලම්, කල්මඩු පියවර - II, ඉරණෙයිඉලුප්පෙයික්කුලම් යන ගම්වල ජීවත්වන ජනතාවට සිය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කි.මී. 70ට වඩා වැඩි දුරක් ගෙවා මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව වෙත යාමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, අදාළ ප්‍රාදේශීය සභා 04 පිහිටුවීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

621/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

733/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් නිලයෙන් පහළ නිලයන්වල සේවය කරනු ලබන උපාධිධාරී පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන උසස්වීම් නොලැබීම හේතුවෙන් එම නිලධාරීන් දැඩි ලෙස කළකිරීමට හා මානසික පීඩාවකට පත් වී ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම නිලධාරීන්ගේ අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන උසස්වීම් ලබා දී ඔවුන්ගෙන් ඵලදායී සේවාවක්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එම නිලධාරීන්ට උසස්වීම් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

800/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ භාවිතය සඳහා මාසික කුලී පදනම මත වාහනයක් ලබා ගෙන තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම වාහනය ලබා ගෙන ඇති දිනය කවරේද;

(ii) ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල කොපමණද;

(iii) වාහනය ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනයේ ලිපිනය කවරේද;

(v) එම වාහනයේ හිමිකරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාව විදේශ විනිමය පිළිබඳ ගැටලු රාශියකට මුහුණ දී තිබෙන මෙවැනි අවස්ථාවක වාහන කුලී පදනමින් ලබාගැනීම අනුමත කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1800/2021

ගරු රෝහණ දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වාභාවික පරිසරයේ නිදැල්ලේ හැසිරෙන රිලවුන් සහ වඳුරන් විසින් වී, එළවළු, පලතුරු, පොල් හා බඩඉරිඟු ආදී වගාවලට සහ නිවාස ආදී දේපළවලටත් ලේනුන්, ගිරවුන් ආදී සතුන්ටත් හානි කරනු ලබන බව දන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට වගකීම පැවරෙන ආයතනයේ නම කවරේද;

(iii) නිදැල්ලේ හැසිරෙන රිලවුන් හා වඳුරන් අල්ලා නිශ්චිතව හඳුනාගන්නා ලද උද්‍යානවලට මුදාහැරීමේ වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අගෝස්තු 18 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

38/2020

ගරු හේෂා විතානගේ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1983 වර්ෂයේදී සිවිල් යුද්ධමය තත්ත්වය ආරම්භ වීමට පෙර උතුරු පළාතේ පැවති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල්—

(i) සංඛ්‍යාව;

(ii) පිහිටා තිබූ ස්ථානවල ලිපිනයන්;

(iii) එම ඉන්ධන පිරවුම්හල්වල අයිතිකරුවන්ගේ නම්;

(iv) ඔවුන්ගේ ලිපිනයන්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ) (iii) හි සඳහන් අයිතිකරුවන් අතරින් උතුරු පළාතේ පැවති සිවිල් යුද්ධමය කාලසීමාව තුළ ඝාතනය වීමෙන්, අතුරුදහන් වීමෙන් හෝ මියයෑමෙන් එම පිරවුම්හල්වල අයිතිය වෙනස් වූයේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම පිරවුම්හල්වල නව අයිතිය ලබා ගත් අයිතිකරුවන්—

(i) සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්;

(iii) ලිපිනයන්;

(iv) පසු අයිතිකරුට, මුල් අයිතිකරුගේ ඥාතීත්වයක් තිබේ නම්, එම ඥාතීත්වය;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්,ඒ මන්ද?

2.

258/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන ක්‍රීඩා පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාඨමාලා කවරේද;

(iii) එම එක් එක් පාඨමාලාව මේ වනවිට හදාරන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන ක්‍රීඩා පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

300/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කඩුවෙල නගරයේ පවතින අධික රථ වාහන තදබදය අවම කිරීම සඳහා යම්කිසි වැඩපිළිවෙළක් රජය විසින් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙල කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

326/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික උභයජීවී විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති උභයජීවී විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික උභයජීවී විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික උභයජීවීන් පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික උභයජීවීන් ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

594/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව;

(ii) එම රෝහලේ මේ වනවිට සිටින සේවක සංඛ්‍යාව;

(iii) එම රෝහලේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

(iv) රෝහලේ රාජකාරියේ යෙදී සිටින වෛද්‍යවරුන් සහ හෙදියන්ගේ සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම සඳහා 2019.02.15 දින මුල්ගල් තැබූ බව දන්නේද;

(ii) එම ඒකකය ඉදිකිරීම සඳහා මුදල් වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු මේ වනතෙක් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iv) මුදල් වෙන් කර නොමැති නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) එම රෝහලේ හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකය ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

604/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහඉලුප්පල්ලම පිහිටි ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් වන සම්පූර්ණ භූමි ප්‍රමාණය;

(ii) ඒ අතරින් බීජ නිෂ්පාදන මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iii) ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iv) ගොවිපොළ යාන්ත්‍රික මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(v) වගා කටයුතුවලට යොදා නොගන්නා භූමි ප්‍රමාණය;

අක්කරවලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වගා කටයුතු සඳහා යොදා නොගන්නා භූමි ප්‍රමාණය වගා කටයුතු සඳහා යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

622/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි වී සිටින මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් වෛද්‍යවරුන් අතර සුදුසුකම් නොමැති වෛද්‍යවරුන්ද සිටින බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

835/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන අපනයන සැකසුම් කලාප සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් අපනයන සැකසුම් කලාපය—

(i) ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) අයත්වන භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණයෙන් මේ වනවිට භාවිතා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්නත් වෙන් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිරියේදී ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අපනයන සැකසුම් කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

854/2020

ගරු අජිත් රාජපක්ෂ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ 05, කිරිමණ්ඩල මාවත යන ලිපිනයේ පවත්වාගෙන යනු ලබන සී/ස ආසිරි ශල්‍ය රෝහල පිහිටි ඉඩම, එම රෝහල ඉදිකිරීමට ප්‍රථම රජය සතුව පැවති ඉඩමක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දුන් පදනම කවරේද;

(ii) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දීමේදී, එළැඹී ගිවිසුමේ සහතික කළ පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1801/2021

ගරු රෝහණ දිසානායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාවට ලබා දෙන ලද රජයේ ඉඩම් සඳහා නිකුත් කර ඇති ඔප්පු වර්ගවල නම් කවරේද;

(ii) එම ඔප්පු වර්ග අතරින් පසු උරුමකරු නම් කර ලබා දෙනු ලබන ඔප්පු වර්ගවල නම් කවරේද;

(iii) එම ඔප්පු යටතේ ලබා දෙන ලද ඉඩම්, පවුලේ සෙසු සාමාජිකයන් අතර නීත්‍යානුකූල ලෙස බෙදා දීම සඳහා පහසු ක්‍රමවේදයක් සැකසීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අගෝස්තු 19 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

40/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් චිත්‍රපට සංරක්ෂණය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්. මේ වන විට සංරක්ෂණය කර ඇති චිත්‍රපට සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ චිත්‍රපට සංරක්ෂණයට අදාළ අංශයේ නිලධාරින්ට චිත්‍රපට සංරක්ෂණය සඳහා විදේශ පුහුණුව ලබා දෙන්නේද;

(ii) එසේනම්, විදේශීය පුහුණුව සඳහා යොමු කරනු ලබන රට සහ ආයතන කවරේද;

(iii) පසුගිය කාලය තුළ විදේශ පුහුණුව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

143/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගෙන ඇති රාජ්‍ය ආයතනවල සහ බැංකුවල නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකී ආයතනවලට හා බැංකුවලට ගෙවීමට ඇති ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

154/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 15හි පිහිටි ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලයේ වාණිජ උපාධි ගුරු තනතුරක සහ ඉංග්‍රීසි, රෝමානු කතෝලික, චිත්‍ර කලාව සහ දෙමළ යන විෂයයන් සඳහා එක් ගුරු පුරප්පාඩුව බැගින් පවතින බවත්;

(ii) මෙම විද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ද කාර්යාල සහායක, පුස්තකාල සහායක, කම්කරු සහ මුරකරු තනතුරු සඳහා එක් පුරප්පාඩුව බැගින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය මඟින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

272/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ 2017 වර්ෂයේදී අභ්‍යන්තර අලුත්වැඩියා කටයුතු සිදුකර ඇති බවත්;

(ii) එහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝණය කරමින් කටයුතු කර ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් විශාල මූල්‍යමය පාඩුවක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අලුත්වැඩියා කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අදාළ ටෙන්ඩරය ප්‍රදානය කරන ලද ආයතනයේ නම කවරේද;

(v) එම ආයතනයට එම ටෙන්ඩරය ප්‍රදානය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ටෙන්ඩරය ප්‍රදානය කරන ලද ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රවාහන අංශයේ ලිපිකරුවෙකු අතර ඥාති සම්බන්ධතාවයක් පවතින බව දන්නේද;

(ii) නොඑසේ නම්, ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදුකරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

579/2020

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය උතුරු පළාතේ සමස්ත භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ඉඩම් පවරා ගැනීමේදී, පෞද්ගලික ඉඩම්, කෘෂිකාර්මික වැව්, කෘෂිකාර්මික ඉඩම් සහ පශු සම්පත් සඳහා වූ තෘණ භූමි ඉඩම් ද පවරාගෙන ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායට මෙන්ම සහජීවනයටද අහිතකර ලෙස බලපෑම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත ඉඩම් පවරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ, ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා නොගැනීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

718/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම, ක්‍රීඩා කටයුතුවලට පහසුවක් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මළල ක්‍රීඩාව සඳහා ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවතින ජාත්‍යන්තර ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(ii) දිස්ත්‍රික් මට්ටමින් අංග සම්පූර්ණ ක්‍රීඩාංගණ ස්ථාපනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

979/2020

ගරු වේලු කුමාර් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වික්ටෝරියා විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සේවය කරන ලද විදේශිකයන් සඳහා කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "දිගන විලේජ්" හි නේවාසික පහසුකම් ලබාදුන් බවත්;

(ii) එහි කාර්යාල ගොඩනැගිලි, භෝජනාගාර හා නේවාසිකාර ආදිය පවතින බවත් ;

(iii) මේ වනවිට එය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පාලනය කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) "දිගන විලේජ්"හි පවතින කාර්යාල ගොඩනැගිලි, භෝජනාගාර සහ නේවාසිකාගාර සංඛ්‍යාව;

(ii) ඒවා මේ වනවිට භාවිතා කරනු ලබන කාර්යයන්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) "දිගන විලේජ්"හි ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් පෞද්ගලික පාර්ශවයකට/ආයතනයකට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය ලබා දෙන ලද පදනම කවරේද;

(iii) එම ගොඩනැගිල්ල ලබා දී ඇති පෞද්ගලික පාර්ශවයේ / ආයතනයේ නම කවරේද;

(iv) එම ප්‍රදේශයේ නීතිවිරෝධී පදිංචි කිරීම් සිදු වී තිබේද;

(v) එසේ නම්, ඊට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

8.

1018/2020

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරයා/අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශය යටතේ පැවති ආයතනවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ඉහත අමාත්‍යාංශය යටතේ පැවතියේද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා එම ආයතනය භාරව කටයුතු කරන ලද සභාපතිවරයා/සභාපතිවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනයට යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

(ii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකොට රු.මි. 670ක් වටිනා යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන තිබේද;

(iii) එම මිලදී ගැනීමේදී යම් අක්‍රමිකතාවයක් සිදු වී තිබේ නම්, එම අක්‍රමිකතාවය කවරේද;

(iv) ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ගේ නම් කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදු කර වරදකරුවන්ට එරෙහිව පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1019/2020

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලංකාවට සම්පතක් වන බවත්;

(ii) පසුගිය රජය සමයේදී එහි වී ගබඩා කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුවන්තොටුපළ තුළ වී ගබඩා කිරීමට හැකියාවක් තිබේද;

(ii) එම ගුවන් තොටුපළේ වී ගබඩා කරන ලද ස්ථානය කවරේද;

(iii) ගබඩා කරන ලද වී ප්‍රමාණය කොපමණද;

(iv) ඒ සඳහා උපදෙස් දෙන ලද පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වී ගබඩා කර තැබීමෙන් පසු එම පරිශ්‍රය යළි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ජාත්‍යන්තර ගුවන් තොටුපළක් තුළ වී ගබඩා කිරීමෙන් ශ්‍රී ලංකාව අන්තර්ජාතික වශයෙන් අපකීර්තියට පත්වූයේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1277/2020

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.01 දින සිට 2020.10.01 දින දක්වා ශ්‍රී ලංකා රජය විසින් විදේශ රටවල්වලින්, විදේශ නියෝජිත ආයතනවලින් හා බැංකුවලින් ලබා ගෙන ඇති ණය සහ ආධාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ණය සහ ආධාර ලබා ගත් අරමුණ, ව්‍යාපෘතිය, වර්ෂය, රට හා අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ණය සහ ආධාර, ඒවා ලබා ගත් නිශ්චිත අරමුණ වෙනුවෙන් යොදවා ඇති බවට සහතික වන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 අගෝස්තු 20 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

42/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ තිබෙන පළාත් සභාවට අයත් මාර්ග සංඛ්‍යාව;

(ii) ඒවායේ මුළු දිග කිලෝමීටර;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය රජයේ කාලසීමාව තුළ පළාත් සභා ප්‍රතිපාදන මත සංවර්ධනය කරනු ලැබූ මාර්ගවල නම් කවරේද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) දැනට අබලන් තත්ත්වයේ පවතින සෙසු පළාත් සභා මාර්ග සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

2.

202/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(ii) එම සංගම් අතරින් නිසි පරිදි නිලවරණ පවත්වා ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(iii) නිලවරණ පැවැත්වීමට බාධා මතු වී ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(iv) නිලවරණ පැවැත්වීමට බාධා මතු වී ඇති ක්‍රීඩා සංගම්වල නිලවරණ පැවැත්වීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

245/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කපු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කපු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම කපු ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කපු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

273/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහන විශාල ප්‍රමාණයක් පවතින බවත්;

(ii) මෙම වාහන දිරාපත් වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහනවල වර්තමාන වටිනාකම කොපමණද;

(ii) එම වාහන පිළිබඳව සංගණනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම සංගණනය සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරනු ලබන වාහන බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

533/2020

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් වන ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඔසුසල් පිහිටි ඇති ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රජයේ ඔසුසල් ශාඛා ජාලය, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

584/2020

ගරු වේලු කුමාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වතු වෛද්‍ය මධ්‍යස්ථාන (Estate Dispensary) ක්‍රියාත්මක වන බවත්;

(ii) එවැනි මධ්‍යස්ථානයක භාරකරු ලෙස වතු වෛද්‍ය සහායක (Estate Medical Assistant) තනතුර දරන්නෙකු කටයුතු කරන බවත්;

(iii) රෝගීන් පරීක්ෂා කර ඖෂධ නියම කිරීම, එම වතු වෛද්‍ය සහායකවරයා විසින් සිදු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව මේ වනවිට ක්‍රියාත්මක වන වතු වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානයන්හි සේවය කරනු ලබන වතු වෛද්‍ය සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වතු වෛද්‍ය සහායකවරුන්ගේ සුදුසුකම් කවරේද;

(iv) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම වතු වෛද්‍ය සහායකවරුන් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

669/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කුඹුක්කන් ඔය වාරි ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) එම වාරි ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වන මුදල් සපයා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම වාරි ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

(v) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

730/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා, — ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (2)

(අ) ශ්‍රී ලංකාවේ —

(i) වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ අවශ්‍යතාවය කොපමණද;

(ii) ඉහළම මිරිදිය මත්ස්‍ය අස්වැන්නක් ලබා දෙන දිස්ත්‍රික්කය කවරේද;

(iii) එම කර්මාන්තයේ නියැලෙන මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ජීවිකාව කරගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;

(iii) එම කර්මාන්තය සිදුකරන වැව් හා ජලාශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් හා ජලාශවලට මුදාහරින ලද මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ එම වැව් හා ජලාශවලින් ලද අස්වැන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුදා හරින ලද මත්ස්‍ය පැටවුන්ට සාපේක්ෂව ලද අස්වැන්න පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) කුඩා වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

786/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශිෂ්‍ය උපදේශන ගුරුවරුන් බඳවා ගැනීම පිණිස පැවති තරඟ විභාගයට පෙනී සිටි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම විභාගය සමත් වූවන්ට මේ වනතෙක් පත්වීම් ලබා දී නොමැති බව එතුමා දන්නේද;

(iv) එසේ නම්, ඉහත විභාගය සමත්වූවන්ට කඩිනමින් පත්වීම් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1017/2020

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "අයි-රෝඩ්" ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් කාපට් අතුරා සංවර්ධනය කිරීමට අනුමත වූ එම දිස්ත්‍රික්කයේ මාර්ගවල දිග කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් කොන්ත්‍රාත්කරු විසින් සංවර්ධනය කිරීම සඳහා ගිවිසුම්ගත වූ මාර්ගවල නම් හා ඒවායේ දිග;

(ii) එම මාර්ග අතරින් මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ජනතා අයිතියට පත් කර ඇති මාර්ගවල නම් හා ඒවායේ දිග;

(iii) මේ වනවිට වැඩ අවසන් කර නොමැති මාර්ගවල නම් හා ඒවායේ දිග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වැඩ අවසන් කර නොමැති මාර්ග සංවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 සැප්තැම්බර් 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

43/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවයේ උප පොලිස් පරීක්ෂක තනතුරේ දැනට සිටින නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) බඳවා ගැනීම් පටිපාටියට අනුව උප පොලිස් පරීක්ෂක තනතුරේ සිටින නිලධාරියකුට, පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය කොපමණද;

(iii) ඒ අනුව, නියමිත සේවා කාල සීමාව සම්පූර්ණ කළ උප පොලිස් පරීක්ෂක වරුන්ට උසස්වීම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

310/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) එම එක් එක් සාමාජිකයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සාමාජිකයාට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් පත් කිරීමේදී විද්වත් කමිටුවේ නිර්දේශ ලබා ගත්තේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

322/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ ක්‍රිකට් ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා වන සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

488/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩා පාසල්වල නම් කවරේද;

(iii) එම එක් එක් ක්‍රීඩා පාසලේ මේ වනවිට ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ට ලබා දෙනු ලබන දීමනා හා වෙනත් පහසුකම් කවරේද;

(v) ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

599/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වූ ඩෙල්ෆ් දූපතේ පවතින රජයේ පාසල් අටක්, භෞතික සම්පත් සහ සේවක ඌනතාවයන් සහිතව ක්‍රියාත්මක වන බවත්;

(ii) ගොඩබිම් මාර්ගයක් නොමැති වීම හේතුවෙන් උසස් අධ්‍යාපනය හැදෑරීමේදී එම දූපතේ ජීවත් වන සිසුන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දූපතේ පිහිටි එක් පාසලක හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා ගණිත හා විද්‍යා විෂය ධාරාවෙන් පෙනීසිටීමට ගණිත හා විද්‍යා අංශ ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) ඉහත සඳහන් පාසල්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට අදාළව ගණිත හා විද්‍යා විෂයයන්ගෙන් හැදෑරීම සඳහා අදාළ ගණිත හා විද්‍යා අංශ ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

6.

725/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) මී උණ රෝගය වැළඳීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුද්ගලයන් මිය යන බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) මී උණ රෝගය වැළඳීම හේතුවෙන් 2019 හා 2020 වර්ෂවලදී මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝගය පැතිරීම වළක්වා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

858/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා හා මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය ජනාධිපතිවරණය ආසන්නයේදී, දේශපාලන හිතවත්කම් මත සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් අවභාවිතා කිරීම හා සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා දේශපාලන පදනමින් පත්වීම් ලබාදීම නීත්‍යානුකූල නොවන බව මැතිවරණ කොමිෂන් සභාව විසින් එවකට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කරන තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒ සම්බන්ධයෙන් වර්තමාන රජය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015.01.12 සිට 2015.06.26 කාලය තුළ සමෘද්ධි විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කළ අමාත්‍යවරයාගේ කාලයේදී රුපියල් ලක්ෂයේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය මුදල;

(ii) එසේ ලබා දුන් ණයවලින් මේ වනවිට අය වී ඇති මුදල;

(iii) තවදුරටත් අයවීමට ඉතිරිව තිබෙන මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එවකට පැවති රජය දේශපාලන පදනමින් තෝරා ගත් පිරිසක් සඳහා මෙම ණය ලබා දුන් බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ සාවද්‍ය ආකාරයෙන් ණය ලබා දීම පිළිබඳව ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

860/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය කවරේද;

(ii) ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති මුළු සුරාබදු ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ සිටින මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුරාබදු දෙපාර්තමේන්තුවේ රජකාරි කටයුතු සඳහා එම නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(iv) සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා නව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

873/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉදිකිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(ii) එය ඉදිකිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියට දැරිය හැකි වන්නේද;

(iv) එම පර්යන්තය ඉදිකිරීමට ගත වන කාලය කොපමණද;

(v) එය ඉදිකිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාර්ෂික ආදායම දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

944/2020

ගරු මයන්ත දිසානායක මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2019 දක්වා මහනුවර, පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟවලින් උපයාගෙන ඇති ආදායම එක් එක් තරගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2010 සිට 2019 දක්වා ඉහත ක්‍රීඩාංගණය නඩත්තු කිරීම සඳහා වෙන් කළ මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් සිදු කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?